ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය

**சுவாமி விபுலானந்த அழகியற் கற்கைகள் நிறுவகம், கிழக்குப் பல்கலைக் கழகம், இலங்கை**

**SWAMI VIPULANANDA INSTITUTE OF AESTHETIC STUDIES, EASTERN UNIVERSITY, SRI LANKA**



# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை - 2015

# Annual Report

# අන්තර්ගතය


| | පිටු අංකය |
|---|---|
| දැක්ම හා මෙහෙවර ප්‍රකාශය | 01 |
| සංවිධාන ව්‍යුහය | 02 |
| කළමණාකරණ මණ්ඩලයේ සාමාජිකයන් | 03 |
| අධ්‍යක්ෂකගේ සමාලෝචනය | 04 |
| ශිෂ්‍ය ප්‍රවේශය හා නිම කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව | 07 |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර | 08 |
| පරිපාලන මණ්ඩලය පිළිබඳ විස්තර | 08 |
| අනධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර | 09 |
| පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර | 09 |
| වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර | 09 |
| ලබාගත් සම්මාන පිළිබඳ විස්තර | 10 |
| පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර | 10 |
| ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර | 10 |
| ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල්) | 11 |
| ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල්) | 11 |
| මූල්‍ය ප්‍රගතිය (වියදම්) පිළිබඳ විස්තර | 11 |
| මූල්‍ය ප්‍රගතිය (උත්පාදිත ආදායම) පිළිබඳ විස්තර | 12 |
| මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය | 12 |
| ඇමුණුම් | 13 |

| | |
|---|---|
| ඇමුණුම් අ | මූල්‍ය ප්‍රකාශන |
| ඇමුණුම් ආ | අභ්‍යන්තර විගණන කමිටු වාර්තා |
| ඇමුණුම් ඇ | විගණකාධිපතිගේ වාර්තාව |
| ඇමුණුම් ඉ | විගණන විමසුම්වලට පිළිතුර |

# අපගේ දැක්ම

සෞන්දර්යාත්මක ශික්ෂණයන්හි

ඉල්ලීම් සැපිරීමේ

ප්‍රමුඛයා බවට පත්වීම

# මෙහෙවර

ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය

සුරැක සාරවත් බවින් යුතුව

තමන් තෝරා ගත් සෞන්දර්ය අධ්‍යයන


ක්ෂේත්‍රයන්හි දැනුම හා නිපුනතා

කුසලතාවයන්ලබා ගැනීමට අවස්ථාවන්

සළසා රැකියාවන්හි නියුක්ත වන පරිදි

උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් බිහි කිරීම

# ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ සංවිධාන ව්‍යුහය



## 3. කළමණාකරණ මණ්ඩලයේ සාමාජිකයන්

| | | |
|---|---|---|
| **සභාපති:** | ආචාර්ය කේ.කෝබින්දරාජා | උප කුලපති, නැගෙනහිර විශ්ව විද්‍යාලය 2015 මාර්තු දක්වා |
| | මහාචාර්ය උමා කුමාරසාමි | බලයලත් අධිකාරි, නැගෙනහිර විශ්ව විද්‍යාලයේ උපකුලපති වෙනුවට - 2015 අප්‍රේල් සිට 2015 දෙසැම්බර් දක්වා |
| **අධ්‍යක්ෂක:** | ආචාර්ය කේ.ප්‍රේමකුමාර් | අධ්‍යක්ෂක/ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය- 2015 අප්‍රේල් දක්වා |
| | මහාචාර්ය ඒ.මුරුගදාස් | වැඩ බලන අධ්‍යක්ෂිකා/ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය- 2015 මැයි සිට2015 දෙසැම්බර් දක්වා |
| | දර්ශණපති එස්. ජෙයසංකර් | අධ්‍යක්ෂක/ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය-2015.12.14 සිට |
| **පීඨාධිපති:** | ආචාර්ය කේ.රාජේන්ද්‍රම් | කලා හා සංස්කෘතික පීඨය, නැගෙනහිර විශ්වවිද්‍යාලය |
| **විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභා නියෝජිතවරුන්:** | | වෛද්‍ය එස්.සිවකුමාරන්<br>ජෝසප් මේරි පියතුමා<br>පූජ්‍ය ශ්‍රීමත් ස්වාමි සර්වරූපානන්දජි මහරාජ් |
| **පාලක සභා නියෝජිතවරුන්:** | | විශ්‍රමලත් මහාචාර්ය එස්.මෞනගුරු<br>ආචාර්ය එන්.තමිල්වානන් |
| **සනාතන මණ්ඩල නියෝජිතවරුන්:** | | වෛද්‍ය කේ.ඊ.කරුණාකරන්<br>පී.සච්චිදානන්දන් මහතා |
| **ශාස්ත්‍රීය පාලක මණ්ඩල නියෝජිතවරුන්:** | | ආචාර්ය එම්.බාලකයිලාසනාදසර්මා<br>ආචාර්ය එම්.සිත්‍රලේඛා මහත්මිය |
| **භාණ්ඩාගාරික නියෝජිත:** | | එන්.නෙඩුන්චේලියන් මහතා |
| **නියෝජ්‍ය ලේඛකාධිකාරි (ලේකම්):** | | ටී. විජයකුමාර් මහතා |

# වාර්ෂික වාර්තාව - 2015

## 03.අධ්‍යක්ෂකගේ සමාලෝචනය

### 3.1හැඳින්වීම

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, පහත සඳහන් අධ්‍යානාංශයන්ගෙන් සමන්විතව ක්‍රියාත්මකවේ.

- කර්නාටක සංගීතඅධ්‍යානාංශය
- නැටුම්, නාට්‍ය හා රංගකලා අධ්‍යානාංශය
- කැටයම් හා තාක්ෂණ කලා අධ්‍යානාංශය

2005 මාර්තු මස 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි බාලාම්බිගෙයි රාජේශ්වරන් මහත්මිය, ශාස්ත්‍රපති (සංගීත)M.A (Music), දර්ශනවේදී (ඉන්දියාව), M.Phil (India),ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය, ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ පළමුවන අධ්‍යක්ෂිකාව ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් පත් කරන ලදී.ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය, ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේදෙවන අධ්‍යක්ෂක ලෙස ආචාර්ය කේ.ප්‍රේමකුමාර්,2012 අප්‍රේල් මස 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී. මහාචාර්ය ඒ.මුරුගදාස් මහත්මිය වැඩ බලන අධ්‍යක්ෂිකා ලෙස මාස අටක කාලයක් සඳහා 2015 අප්‍රේල් මස 29 දින සිට පත් කරනු ලැබුවාය.දැනට ආචාර්ය එස්.ජේයසංකර් මහතා අධ්‍යක්ෂක ලෙස 2015 දෙසැම්බර් මස 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවය කරයි.

### 3.2 උගන්වනු ලබන විෂයයන්

- කර්නාටක සංගීතය
- නැටුම් ( භාරත )
- නාට්‍ය හා රංග කලාව
- කැටයම් හා තාක්ෂණ කලාව

## 3.3ව්‍යවස්ථාපිත මණ්ඩල

ශාස්ත්‍රීය පාලක මණ්ඩලය : සියළු අධ්‍යයන කටයුතු මෙහෙයවනු ලබයි.

කළමණාකරණ මණ්ඩලය : සියළු පරිපාලන, අධ්‍යයන හා මූල්‍ය කටයුතු මෙහෙයවනු ලැබීම හා අනුමත කිරීම් සිදු කෙරේ.
පාලක සභාව/ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය : කළමණාකරණ මණ්ඩලයේ රැස්වීම් වාර්තා පාලක සභාවේ තීරණය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

## 3.4 මුදුන්පමුණුවා ගැනීම්

### 3.4.1 සංස්කෘතිකමය වැඩ සටහන් මඟින් ප්‍රජාවන් අතර ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම

මඩකලපුව කච්චේරිය, දිසා අධිකරණ, බැංකු, මඩ/ශික්ෂණ රෝහල, අධ්‍යාපන කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා වෙනත් ආයතනවල සංවිධානය කරන ලද ඉහළ මට්ටමක වූ උත්සවවලදී අපගේ සිසුන් සෑම විටකම පිළිගැනීමේ නැටුම් හා වෙනත් සංස්කෘතික වැඩ සටහන් සංවිධානය කිරීමේදී සහභාගි වූහ.

### 3.4.2සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

පසුගිය වසර විසිපහකට අධික කාලයක් පුරා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය, ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය විසින් ප්‍රාදේශීය හා ජාතියේ විශිෂ්ඨතම සංස්කෘතික උරුමයන් ප්‍රවර්ධනය කිරීම හා සුරැකීම උදෙසා කැපී පෙනෙන කාර්‍යභාරයක් ඉටු කර ඇත.මෙම ඉලක්කය කරාජන හා සාම්ප්‍රදායික සංස්කෘතිය,කූත්තු, නාට්‍යයන් වැනි විවිධ සංස්කෘතික වැඩ සටහන් සංවිධානය කරනු ලැබිණ.

### 3.4.3 ප්‍රදර්ශණය

2015 සැප්තැම්බර්16 වනදා සිට 18දින දක්වා වර්ණ හා නිර්මාණ සඳහාවූ ප්‍රදර්ශණයක් කැටයම් හා තාක්ෂණ කලා/ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලදී.

## 3.5 පවත්වන ලද වැඩමුළු

| අංකය | පවත්වන ලද දිනය | වැඩමුළුවේ මාතෘකාව |
|---|---|---|
| 01 | 22/23.01.2015 | උසස් අධ්‍යාපන ආයතනවල මූල්‍ය හා මූල්‍ය නොවන වෘත්තිකයන් සඳහා රාජ්‍ය අංශයේ මූල්‍ය කළමණාකරණය පිළිබඳ වැඩමුළුව - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |
| 02 | 11,18, 25.03.2015, 01.04.2015 | ස්වයං දැනුවත්භාවය පිළිබඳ වැඩමුළුව-බ්‍රහ්මකුමාරිහල් /රාජයෝග නිලයම්, මඩකලපුව |
| 03 | 28.02.2015 | සංකේත සම්පාදනය හා සම්ප්‍රේෂණය කරන ආකාරය කෙසේද යනුවෙන් වූ වැඩමුළුව (හින්දුස්තානි සිට කර්නාටකයට සහ ප්‍රතිලෝමව) මානව විශිෂ්ඨතාආයතනය |
| 04 | 27.02.2015 | විශ්ව විද්‍යාලවල නවක වදය පිළිබඳ වැඩමුළුව - මානව හිමිකම් කොමිසම් සභාව |
| 05 | 20.03.2015 | SERලේඛකයන් පිළිබඳ වැඩමුළුව -HETC/නැගෙනහිර විශ්ව විද්‍යාලය |
| 06 | 16.05.2015-17.05.2015 | යාපනය සංගීත උත්සව වැඩමුළුව - සේවා ලංකා පදනම,කළුතර |
| 07 | 28.05.2015 | නර්තන වැඩමුළුව - මාලිනි පරරාජසිංගම් මෙනවිය, කීර්තිමත් නර්තන ශිල්පිණියක්, කැනඩාව |
| 08 | 27/28.06.2015 | නර්තන වැඩමුළුව - චිත්‍රසේන - වජිරා නර්තන පදනම |
| 09 | 08.07.2015 | ශිෂ්‍යයන් සඳහා වැඩමුළුව - EHED, මඩකලපුව |
| 10 | 16.07.2015 | උපදේශන වැඩමුළුව - වෛද්‍ය ටී.ගඩම්බනාදන් |
| 11 | 28.08.2015 | උපායමාර්ගික සැළසුම්කරණය පිළිබඳ වැඩමුළුව/කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය/නැගෙනහිර විශ්ව විද්‍යාලය |
| 12 | 13-16.11.2015 | ප්‍රසංගය නෝර්වේ සංගීත විශ්ව විද්‍යාලයේ අනුග්‍රහය ඇතිව වැඩමුළුව - පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| 13 | 08.12.2015 | කළමණාකරණ මාර්ගෝපදේශක අත්පොත සහ විශ්ව විද්‍යාල දින සටහන් අත්පොත නිම කිරීම සඳහා වැඩමුළුව-කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය/නැගෙනහිර විශ්ව විද්‍යාලය |

## 3.6 සංගීත හා නර්තන වැඩ සටහන

| අංකය | පවත්වන ලද දිනය | සංගීත වැඩ සටහන පිළිබඳ විස්තර |
|---|---|---|
| 01 | 25/26.02.2015 | කර්නාටක සංගීත හා නර්තන ශ්‍රී ත්‍යාගරාජා ආරාධනා උළෙල- ඉන්දියානු සංස්කෘතික මධ්‍යස්ථානය |
| 02 | 19.09.2015 | පිළිගැනීමේ නැටුම්- EHED, මඩකලපුව |
| 03 | 04/05.10.2015 | නර්තන, නාට්‍ය උළෙල-යාපනය විශ්ව විද්‍යාලය |
| 04 | 18.10.2015 | නර්තන වැඩ සටහන-සක්ති රූපවාහිනිය |

## 3.7 යටිතල පහසුකම්

කාන්තා නේවාසිකාගාරය “සරසවි මැදුර”09.02.2015 දිනදී උත්සවශ්‍රීයෙන් විවෘත කරන ලදී.

## 04. උපාධිධාරී සිසුන් පිළිබඳ විස්තර

| අධ්‍යනාංශය | පාඨමාලාව | මාධ්‍යය | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ඇතුළුවූ | පිටවූ | ඇතුළුවූ | පිටවූ | ඇතුළුවූ | පිටවූ |
| සංගීතය | ලලිත කලා උපාධිදාරී (සංගීතය) | දමිළ | 25 | 19 | 38 | 30 | 61 | 27 |
| නැටුම් හා නාට්‍ය හා රංග කලාව | ලලිත කලා උපාධිදාරී (නැටුම්) | | 25 | 22 | 29 | 31 | 31 | 22 |
| | ලලිත කලා උපාධිදාරී (නාට්‍ය හා රංග කලාව) | | 50 | 46 | 39 | 39 | 35 | 30 |
| කැටයම් කලාව | ලලිත කලා උපාධිදාරී (කැටයම් කලාව) | | 43 | 33 | 46 | 45 | 45 | 33 |
| **එකතුව** | | | **143** | **120** | **152** | **145** | **172** | **112** |

එක් එක් අධ්‍යයන අංශ සඳහා අනුමත වාර්ෂික සිසුන් බඳවා ගැනීම පහත පරිදි වේ.

## 5. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| අධ්‍යනාංශය | පාඨමාලාව | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය (ස්ථාවර) | කථිකාචාර්ය (පරිවාස) | සහකාර පුස්තකාලයාධිපති | උපදේශක |
|---|---|---|---|---|---|---|---|---|---|
| සංගීතය | ලලිත කලා උපාධිදාරි (සංගීතය) | සිංහල | – | – | 02 | 11 | 03 | – | 03 |
| නැටුම් හා නාට්‍ය හා රංග කලාව | ලලිත කලා උපාධිදාරි (නැටුම්) | | – | – | 03 | 02 | 02 | | – |
| | ලලිත කලා උපාධිදාරි (නාට්‍ය හා රංග බලාව) | | – | - | 03 | 05 | 03 | | – |
| කැටයම් කලාව | ලලිත කලා උපාධිදාරි (කැටයම් කලාව) | | – | – | - | 07 | 02 | | 01 |
| පුස්තකාලය | | | – | – | – | – | – | | – |
| පරිඝණක ඒකකය | | | – | – | – | – | – | 01 | – |
| **එකතුව** | | | **–** | **–** | **08** | **25** | **10** | **01** | **04** |

එක් එක් අධ්‍යයන අංශ සඳහා වූ ශිෂ්‍ය/ගුරු අනුපාතය ප්‍රමාණවත් මට්ටමක නොමැති බැවින් නව පුරප්පාඩු බිහි කිරීම සඳහා කටයුතු යොදන ලදී.

## 6. පාලන මණ්ඩලය පිළිබඳ විස්තර

| දෙපාර්තමේන්තුව | විධායක කාර්ය මණ්ඩලය |
|---|---|
| ආයතන හා සාමාන්‍ය පරිපාලනය | 01 |
| පරීක්ෂණ හා ශිෂ්‍ය ප්‍රවේශ | 01 |
| ශිෂ්‍ය සුභසාධනය | 01 |
| මුදල් ශාඛාව | 01 |
| **එකතුව** | 04 |

ඉහල යන ලද ශිෂ්‍ය සංඛ්‍යාව හා ආයතනයේ ක්‍රියාකාරීත්වය පුලුල් කිරීම හේතුවෙන් පාලන කාර්ය මණ්ඩලය සඳහා නව පුරප්පාඩු බිහි කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

## 7. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| අධ්‍යයනාංශය | කාර්මික කාර්ය මණ්ඩලය | ලිපිකරු හා සමාන්තර කාර්ය මණ්ඩලය | සුළු සේවක |
|---|---|---|---|
| සංගීත | - | - | 01 |
| නැටුම් හා නාට්‍ය හා රංග කලාව | - | - | 02 |
| කැටයම් හා තාක්ෂණ කලාව | - | - | 02 |
| පුස්තකාලය | - | 02 | 02 |
| මුදල් | - | 04 | 01 |
| පරිපාලනය | 02 | 08 | 19 |
| **එකතුව** | 02 | 14 | 27 |

24.10.2014 කම්කරු අංශය සඳහා සේවකයින් 9 දෙනෙකුද රියදුරු තනතුර සඳහාසේවකයින් 2 දෙනෙකුද කොමිෂන් සභා චක්‍රලේඛණ අංක 25/2014 යටතේ පත් කරන ලදී.

## 8. පර්යේෂණ,නවෝත්පාදන හා ප්‍රකාශණ පිළිබඳ විස්තර

| **විෂයය** | **ප්‍රකාශනයට පත් කරන ලද** | **ඉදිරිපත් කරන ලද** |
|---|---|---|
| අ.පර්යේෂණ ගණන | 61 | 25 |
| ආ.නවොත්පාදන ගණන | – | 02 |
| ඇ.සඟරා ගණන | – | – |
| ඈ.පොත් ගණන | – | 13 |
| ඉ.ප්‍රවෘත්ති ලිපි | – | 03 |
| ඊ.වෙනත් (පොත් කවර නිර්මාණ | – | - |
| **එකතුව** | **61** | **43** |

සියලු අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයින් තම විෂය ක්ෂේත්‍රයන්ට අදාලව පර්යේෂණ කටයුතු වල වසර පුරා නිරතව සිටින ලදී.

## 9. වැඩ සටහන්,සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර

| විෂයය | සහභාගි වන ලද | නිම කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| අ. පශ්චාත් උපාධි පාඨමාලා ගණන | 16 | 7 | 7 |
| ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා ගණන | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| ඇ. උපාධි පාඨමාලා ගණන | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| ඈ. ඩිප්ලෝමා පාඨමාලා ගණන | 4 | 2 | 8 |
| ඉ. සහතික පත්‍රපාඨමාලා ගණන | 8 | 8 | 5 |
| ඊ. වෙනත් | - | - | - |
| **එකතුව** | **28** | **17** | **14** |

අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයින් 16 දෙනෙකු පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ අතර ඉන් 7 දෙනෙකු තම පාඨමාලා අවසන් කොට වාර්තා ඉදිරිපත් කරන ලදී.

## 10. ලබා ගත් සම්මාන පිළිබඳ විස්තර

| විෂයය | සම්මාන ගණන | අධ්‍යයන කාර්‍ය මණ්ඩලය | ශිෂ්‍යයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| අ. දේශීය සම්මාන | 21 | 01 | 20 |
| ආ. ජාතිකසම්මාන | 23 | - | 23 |
| ඇ. ජාත්‍යයන්තර සම්මාන | 07 | 07 | - |
| ඈ. වෙනත් | - | - | - |
| **එකතුව** | **51** | **08** | **43** |

අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයින්8 දෙනෙකු හා ශිෂ්‍යයන් 43 දෙනෙකු තම අධ්‍යයන ක්ෂේත්‍රයන් ඔස්සේ සම්මාන ජයග්‍රහණය කරන ලදී.

## 11. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| විෂයය | | 2014 රු. | | 2015 රු. |
|---|---|---|---|---|
| අ. පුද්ගල වේතන | | 56,174,575.33 | | 88,530,821.74 |
| ආ.ගමනාගමනය | | 213,288.50 | | 146,776.36 |
| ඇ. සැපයීම් | | 3,301,597.44 | | 3,862,024.68 |
| ඈ.නඩත්තුව | | 1,981,610.31 | | 2,070,515.72 |
| ඉ.කොන්ත්‍රාත් සේවා | | 15,804,870.02 | | 24,446,631.21 |
| ඊ.වෙනත් | | 6,321,910.80 | | 8,615,336.29 |
| **එකතුව** | | **83,797,852.40** | | **127,672,106.00** |

වසර තුල බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව ඉහල යාමත්, බාහිර සේවා ලබා ගැනීම නිසා කොන්ත්‍රාත් සේවා ඉහල යාමත්, වැටුප් සංශෝධනයන් සිදු කිරීමත් හේතුවෙන් වැටුප් හා වේතන සඳහා වන වියදම්ඉහල යන ලදී.

## 12. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

| විෂයය | 2014 රු. | 2015 රු. |
|---|---|---|
| අ. ලී භාණ්ඩ හා කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම | 12,879,055.95 | 23,297,515.00 |
| ආ. යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම | - | 18,685,397.49 |
| ඇ. ගොඩනැගිලි හා ව්‍යුහයන් අත්පත් කර ගැනීම | 9,631,994.42 | 21,845,231.84 |
| ඉ. වෙනත් | 17,200.00 | 749,957.45 |
| **එකතුව** | **22,528,250.37** | **64.578,101.78** |

ඉහල යන ලද නවක ශිෂ්‍යය සංඛ්‍යාවට සාපේක්ෂවලී භාණ්ඩ හා කාර්යාල උපකරණ, ගොඩනැගිලි හා ව්‍යුහයන් අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම් ඉහල යන ලදී.

## 13. ව්‍යාපෘති (දේශීය/විදේශීය අරමුදල් යොදන ලද) පිළිබඳ විස්තර

| නම හා විස්තර | ණය/ප්‍රදාන | අරමුදල් යොදන නියෝජිතායතනය | මුළු පිරිවැය ඇස්තමේන්තුව | RFA රු. | DFරු. |
|---|---|---|---|---|---|
| HETC ව්‍යාපෘතිය | ප්‍රදාන | ලෝක බැංකුව | රු මිලියන 15 | | |
| | - | - | | | |
| **එකතුව** | - | - | රු මිලියන 15 | | |

තොරතුරු තාක්ෂණ, ඉංග්‍රීසි දැනුම, පුද්ගල කුසලතා හා සමාජ සංස්කෘතීන් දියුණු කිරීම සඳහා ලෝක බැංකු HETC ව්‍යාපෘතිය යටතේ රුග මිලියන 15ක් ආයතනයට ප්‍රදානය කරන ලදී.

## 14. ව්‍යාපෘති වියදම් (දේශීය/විදේශීය අරමුදල්) පිළිබඳ විස්තර

| නම | මුළු පිරිවැය ඇස්තමේන්තුව | 2013දී වියදම් රු. | 2014දී වියදම් රු. | 31.12.2015ට සමුච්චිත වියදම් | % භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| HETC ව්‍යාපෘතිය | මිරු 15 | 462,986.00 | 2,885,929.20 | 6,443,056.43 | 71.59% |
| **එකතුව** | | **462,986.00** | **2,885,929.20** | **6,443,056.43** | **71.59%** |

## 15. දිනට මූල්‍ය ප්‍රගතිය (වියදම්) පිළිබඳ විස්තර

| විෂයය | 2015 දී සැළසුම් රු. | 2015 දී වියදම් රු. | ඉතුරුම්/අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. පුනරාවර්තන වියදම් ව්‍යාපෘතිය | 136,900,000.00 | 134,411,894.69 | 2,488,105.31 |
| ආ. ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘතිය | 50,000,000.00 | 64,578,101.78 | (14,578,101.78) |
| ඇ. ව්‍යාපෘතිය-දේශීය අරමුදල් | - | - | - |
| ඈ. ව්‍යාපෘතිය-විදේශීය අරමුදල් | - | - | - |
| **එකතුව** | **186,900,000.00** | **198,989,996.47** | **12,089,996.47** |

උපාධි පාඨමාලා හැර වෙනත් දීර්ඝ පාඨමාලා ආයතනය මගින් නොපැවැත්වීම හේතුවෙන් ආදායම් ඉපැයීම් සිදු කරනු ලබන්නේ උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය මගින් පමණි.

## 16. දිනට මූල්‍ය ප්‍රගතිය (උත්පාදනය කරන ලද ආදායම) පිළිබඳ විස්තර

| ආදායම් මාර්ගය | 2015 දී ප්‍රතිපාදන රු. | 2015 දී එකතු කිරීම් රු. | උණතාවය /අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. උපාධිධාරී අපේක්ෂක අධ්‍යයනය | 1,235,000.00 | 1,411,924.41 | 176,924.41 |
| ආ. පශ්චාත් අධ්‍යයනය | - | - | - |
| ඇ. උපදේශන සේවා | - | - | - |
| ඉ. වෙනත් | 50,000.00 | 80,700.00 | 30,700.00 |
| **එකතුව** | **1,285,000.00** | **1,492,624.41** | **207624.41** |

## 17. මූල්‍ය කාර්‍යසාධන විශ්ලේෂණය

| විෂයය | ගණනය කල ආකාරය | ඒක ශිෂ්‍ය පිරිවැය රු. |
|---|---|---|
| අ.ශිෂ්‍යයෙකු සඳහා පුනරාවර්තන වියදම් (පුවි) | (පුවි) / ශිෂ්‍ය සංඛ්‍යාව | 125,853.83 |
| ආ.ශිෂ්‍යයෙකු සඳහා ප්‍රාග්ධන වියදම් (පුවි) | (ප්‍රාවි) / ශිෂ්‍ය සංඛ්‍යාව | 60,466.39 |
| **එකතුව** | - | **186,320.22** |

**ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය**
**31, දෙසැම්බර් 2015 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | 2015 | 2014 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම් නොවන** | | | |
| දේපළ, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 09 | 133,528,648.70 | 75,990,581.45 |
| **ජංගම වත්කම්** | | | |
| ඉන්වෙන්ටරි | | 1,402,827.42 | 1,102,581.59 |
| ණය හා අත්තිකාරම් | 10 | 7,751,041.60 | 6,320,768.92 |
| සැපයුම්කරුවන්ට හා කොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් | 11 | 550,339.06 | 7,139,072.13 |
| මුදල් හා මුදල් සමාන | 13 | 61,510,157.32 | 52,138,986.78 |
| | | 71.214,365.40 | 66,701,409.42 |
| **මුළු වත්කම්** | | **204,743,014.10** | **142,691,990.87** |
| **මූලධනය හා වගකීම්** | | | |
| **වගකීම්** | | | |
| ජංගම වගකීම් | | | |
| ණයහිමියෝ | 14 | 9,450,613.43 | 1,936,380.55 |
| රඳවා ගැනීමේ මුදල් - කොන්ත්‍රාත්කරුවන් | | 1,881,648.60 | - |
| පාරිතෝෂික ලබා දීම සඳහා විධිවිධාන | | 5,031,837.50 | - |
| ගෙවිය යුතු මහපොළ/ශිෂ්‍යාධාර | 12 | 890.00 | 2,238,940.00 |
| විගණන ගාස්තු සඳහා විධිවිධාන | | 200,000.00 | - |
| **මුළු වගකීම්** | | 16,564,989.53 | 10,175,320.55 |
| **මූලධනය** | | | |
| සමුච්චිත අරමුදල් (ප්‍රාග්ධන ප්‍රදාන)/සංචිත සමුච්චිත ප්‍රාග්ධන ප්‍රදාන | 15 | 209,550,112.78 | 159,550,112.78 |
| වෙනත් ප්‍රදාන | | 1,000,000.00 | 1,000,000.00 |
| වෙනත් අරමුදල | | 1,500,000.00 | 1,500,000.00 |
| සාමාන්‍ය සංචිත | | (23,872, 088.21) | (29,533,442.47) |
| | | 188,178,024.57 | 132,516,670.31 |
| **මුළු මූලධනය හා වගකීම්** | | **204,743,014.10** | **142,691,990.86** |

මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය අංගයන් වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් පිටු 06 සිට 13 දක්වා අන්තර්ගතවේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව 1978 අංක: 16 දරණ විශ්ව විද්‍යාල පණතේ 106 (1) හා 107 (1) (බී) වගන්ති ප්‍රකාරව සහ 1971 අංක: 38 දරණ මුදල් පණතේ 13 (6) වගන්තිය ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කරන ලදී.

| | | |
|---|---|---|
| ආචාර්ය එස්.ජේයසංකර් | ටී.විජයකුමාර් | එම්.කේ.ඩී.ලක්මාලී |
| අධ්‍යක්ෂ/ගිණුම් නිළධාරියා | නියෝජ්‍ය ලේඛකාධිකාරී | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී |

**ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය**

**2015 වසර අවසානය සඳහා මූල්‍ය කාර්ය සාධනය**

| | සටහන | 2015 | 2014 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් ආදායම** | | | |
| පුනරාවර්තන දීමනා | | 136, 900,000.00 | 74,000,000.00 |
| ලියාපදිංචි කිරීමේ ගාස්තු (උපාධි අපේක්ෂකයින්) | | 718,900.00 | 1,060,850.50 |
| පරීක්ෂණ ගාස්තු (උපාධි අපේක්ෂකයින්) | | 49,000.00 | 524,950.00 |
| ණය හා අත්තිකාරම්වලින් පොළිය | | 160,756.41 | 139,411.55 |
| නේවාසිකාගාර ගාස්තු | | 243,700.00 | 708,565.57 |
| ගොවිපළ නිෂ්පාදන විකිණීම් | | – | 300.00 |
| දඩ මුදල් | | 22,733.00 | 70,727.50 |
| දේපළවලින් කුලිය | | 46,000.00 | 5,750.00 |
| වෛද්‍ය ගාස්තු | | 101,700.00 | 156,197.00 |
| පැරණි තොග ගාස්තු | | 60,135.00 | 11,910.00 |
| ජීවන වියදම් හිඟ මුදල් (ජීවිහිමු) | | 35,208.12 | - |
| ආපසු නොගෙවනු ලබන තැන්පතු | | 80,700.00 | 144,400.00 |
| විවිධ රිසිට්පත් | | 9,000.00 | 64,900.00 |
| | | **138,427,832.53** | **76,887,962.12** |
| | | ============ | =========== |
| **මෙහෙයුම් වියදම්** | | | |
| **පුද්ගල වේතන** | | | |
| වැටුප් හා වේතන | | 25,903,458.98 | 28,622,722.42 |
| විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල් | | 3,833,419.25 | 3,802,413.43 |
| විශ්‍රාම | | 2,866,736.29 | 1,802,413.43 |
| සේවක භාරකාර අරමුදල් | | 1,347,150.74 | 967,624.06 |
| වැඩ බලන ගෙවීම් | | 500,239.22 | 180,692.50 |
| ජීවන වියදම් දීමනා | | 8,580,926.18 | 5,811,5347.70 |
| අධ්‍යයන දීමනා | | 8,072,207.01 | 6,285,210.40 |
| විශේෂ දීමනා | | 5,170,172.14 | 3,989,886.97 |
| පර්යේෂණ දීමනා | | 8,185,794.66 | 342,754.18 |
| අතිකාල | | 1,054,838.45 | 879,493.65 |
| නිවාඩු ගෙවීම් | | 36,372.00 | 33,459.00 |
| වෙනත් දීමනා | | 14,400.00 | 14,000.00 |
| බාහිර දේශණ ගාස්තු | | 1,601,050.00 | 1,202,350.00 |
| අමතර මාසික දීමනා | | 5,160,052.89 | 2,150,757.35 |
| මධ්‍යම කාලීන දීමනා | | 9,320,820.90 | 414,787.10 |
| මාසික වන්දි දීමනා | | 1,799,269.13 | - |
| ජායා පිටපත් දීමනා | | 17,850.00 | 7,875.00 |
| පාරිතෝෂික | | 5,066,063.90 | 436,010.00 |
| ගමනාගමනය | 04 | 146,776.36 | 213,288.50 |
| සැපයීම් හා භාවිතා කළ පාරිභෝගික | 05 | 3,561,778.85 | 3,444,920.65 |
| නඩත්තු වියදම් | 06 | 2,070,515.72 | 2,257,031.86 |
| කොන්ත්‍රාත් සේවා | 07 | 24,446,631.21 | 19,308,968.54 |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂයවීම් වියදම් | | 7,040,034.52 | 6,224,959.89 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 08 | 8,615,336.29 | 6,183,569.25 |
| මුළු මෙහෙයුම් වියදම් | | **134,411,891.69** | **93,807,314.02** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය/(හිඟය) | | **4,015,937.84** | **(16,919,351.90)** |
| ඉදිරියට ගෙන ආ ශේෂය | | ( 27,888,026.05) | (12,614,090.57) |
| ඉදිරියට ගෙනගිය ශේෂය | | 4,015,937.84 | ( 16,919,351.90) |
| | | **(23,872,088.21)** | **( 29,533,442.47)** |

**ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය**
**දෙසැම්බර් 31, 2015 වසර අවසානය දක්වා වූ**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන | 2015 | 2014 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| වර්ෂය සඳහා හිඟය | | 4,015,937.84 | (16,824,949.20) |
| **මුදල් හුවමාරු නොකරන භාණ්ඩ සඳහා ගැලපීම** | | | |
| ක්ෂයවීම | | 7,040,034.52 | 6,130,557.19 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වැඩි කිරීම | | 5,031,837.50 | |
| පූර්ව කාල භාණ්ඩ | | 1,645,416.42 | - |
| කාරක ප්‍රාග්ධනයෙහි වෙනස්වීම්වලට පෙට මෙහෙයුම් හිඟය | | 17,733,226.28 | (10,694,392.01) |
| **කාරක ප්‍රාග්ධන අයිතමයන්හි වෙනස්කම්** | | | |
| ණය හා අත්තිකාරම්වල වැඩිවීම | | (1,430,272.68) | 747,019.73 |
| සැපයුම්කරුවන්ගේ හා කොන්ත්‍රාත්කරුවන්ගේ අත්තිකාරම් අඩුවීම | | 6,588,733.07 | (879,805.28) |
| විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වැඩිවීම –කොන්ත්‍රාත්කරුවන් | | 200,000.00 | |
| රඳවා ගැනීමේ මුදල් වැඩිවීම – කොන්ත්‍රාත්කරුවන් | | 1,881,648.60 | (204,852.34) |
| ආරක්ෂක තැන්පතු වැඩිවීම – කොන්ත්‍රාත්කරුවන් | | - | ( 252,643.79) |
| අතේ ඇති තොග වැඩිවීම | | (300,245.83) | 143,323.21 |
| ලැබිය යුතු මහපොළ/ශිෂ්‍යාධාර අඩුවීම | | (2,238,050.00) | 1,862,850.00 |
| ණයහිමියන් වැඩිවීම | | 1,514,232.88 | 14,631.75 |
| | | 6,216,046.04 | 1,430,523.28 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උපයෝගි කරගත් මුදල් | | 23,949,272.32 | (9,263,868.73) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| ස්ථාවර වත්කම් මිළදී ගැනීම | | (64,578,101.78) | (12,879,055.95) |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| මූලධන ප්‍රදාන | | 50,000,000.00 | 45,000,000.00 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් උත්පාදිත ශුද්ධ මුදල් | | 50,000,000.00 | 45,000,000.00 |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් ප්‍රමාණවලින් ශුද්ධ වර්ධනය | | 9,371,170.54 | 22,857,075.32 |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් ප්‍රමාණවල ශේෂය | | 52,138,986.78 | 29,281,911.46 |
| වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් ප්‍රමාණවල ශේෂය | | 61,510,157.32 | 52,138,986.78 |

සටහන

| | |
|---|---|
| බැංකුවේ ඇති මුදල් | 61,510,157.32 |
| එකතුව | 61,510,157.32 |

ආචාර්ය එස්.ජේයසංකර් — අධ්‍යක්ෂ/ගිණුම් නිළධාරියා

එම්.කේ.ඩී.ලක්මාලී — ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි

**ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය**
**31, දෙසැම්බර් මස අවසානය සඳහා වූ**
**ශුද්ධ වත්කම්වල වෙනස්කම් ප්‍රකාශය**

| | සමුච්චිත අරමුදල | සාමාන්‍ය සංචිතය | එකතුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **31, දෙසැම්බර්, 2013 දිනට ශේෂය** | 106,708,799.72 | (12,614,090.57) | 94,094,709.15 |
| ප්‍රාග්ධන ප්‍රදාන | 45,000,000.00 | | 45,000,000.00 |
| කාලය සඳහා අතිරික්තය/(ඌණතාවය) | _ | (16,919,351.90) | (16,919,351.90) |
| **31, දෙසැම්බර්, 2014 දිනට ශේෂය** | **151,708,799.72** | **(29,533,442.47)** | **122,175,357.25** |
| ප්‍රාග්ධන ප්‍රදාන | 50,000,000.00 | _ | 50,000,000.00 |
| ශ්‍රීලංනැවි-පූර්ව වසර ගැලපීම | | 1,645,416.42 | |
| කාලය සඳහා අතිරික්තය/(ඌණතාවය) | _ | 4,015,937.84 | 4,015,937.84 |
| **31, දෙසැම්බර්, 2015 දිනට ශේෂය** | **201,708,799.72** | **(23,872,088.21)** | **177,836,711.51** |
| | ============ | ============ | =========== |

## විගණන කමිටු වාර්තාව - 2015

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාල ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ විගණන කමිටුව කළමණාකරණ මණ්ඩලයේ උප කමිටුවක්වේ. පස් දෙනෙකුගෙන් යුක්ත වූ සාමාජික කමිටුව වාර්ෂිකව කාර්තුමය වශයෙන් හමුවන අතර අනාගත පරම්පරාව කෙරෙහි විශ්වාසයෙන් යුතුව විශ්ව විද්‍යාලයේ මූල්‍යය, පරිපාලනය, මානව වත්කම් හා මෙහෙයුම් පිළිබඳව සාකච්ඡා කරයි. එහි සාමාජිකත්වයේ නිලතල නියමයන්, වගකීම්, බලතල සහ මැතිවරණ පටිපාටිය පාලනය කරනු ලබන්නේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව සහ ආයතනයේ කළමණාකරණ මණ්ඩලය මඟින් ශ්‍රී ලංකා භාණ්ඩාගාරය විසිනි.

### 1. **විගණන කමිටුව සඳහා** වන කොන්දේසි ක්‍රමවේදය:

i. අභ්‍යයන්තර විගණන අංශයේ වගකීම් නිර්ණය කිරීම සහ වාර්ෂික විගණන සැළසුම් සමාලෝචනය කිරීම.
ii. ආයතනයේ සියළු ක්‍රියාකාරකම් සඳහා අභ්‍යයන්තර පාලන පද්ධතිය පිළිබඳව සමාලෝචනය කිරීම හා අගැයීම.
iii. අභ්‍යයන්තර විගණන සැළැස්ම හා අභ්‍යයන්තර විගණක විසින් සකස් කරන ලද වැඩ සටහන නිරීක්ෂණය කිරීම හා නිර්දේශ කිරීම.
iv. පිරිවැය ඵලදායිතාවය සඳහා විධිමත් කාලන්තරයන් තුළ කාර්ය සාධනය සමාලෝචනය කිරීම හා නිෂ්ඵල වියදම් ආදිය තුරන් කිරීම.
v. බාහිර විගණකවරුන් සමඟ සබඳතා පවත්වා විගණකාධිපතිවරයාගේ/ බාහිර විගණකවරුන් කළමණාකරණ ලිපි අනුගමනය කිරීම.
vi. ප්‍රඥාප්ති, රෙගුලාසි, නීතිරීති, චක්‍රලේඛ අනුකූලද යන්න නිශ්චය කර ගැනීම.
vii. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම තහවුරු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
viii. පිළියම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා අභ්‍යයන්තර විගණන/බාහිර විගණන වාර්තා කළමණාකරණ ලිපි සමාලෝචනය කිරීම.
ix. පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.
x. වාර්ෂික වාර්තාවට ඇතුලත් කිරීම සඳහා කමිටුවේ සොයා ගැනීම් පිළිබඳ වාර්තාව සකස් කිරීම.

### 2. විගණන කමිටුවේ සාමාජිකයන්

| සාමාජිකයාගේ නම | තනතුර හා සුදුසුකම් |
|---|---|
| **අ) මණ්ඩලයෙන් පත් කරන ලද සාමාජිකයන්** | |
| 1. ආර්.නෙඩුන්චේලියන් මහතා (සභාපති) | සැළසුම් අධ්‍යක්ෂක<br>දිස්ත්‍රික් සැළසුම් ලේකම් කාර්යාලය<br>මඩකලපුව |
| 2. ජෝසප් මේරි පියතුමා | අධ්‍යක්ෂක<br>මැන්රෙසා රිට්‍රීට් හවුස්, මඩකලපුව |

| | |
|---|---|
| 3. පූජ්‍ය ශ්‍රීමත් ස්වාමි සර්වරූපානන්දජි | උප සභාපති<br>රාමක්‍රිෂ්ණා මිෂන් ශ්‍රී ලංකාව |
| **ආ) Ex officio සාමාජිකයන්** | |
| ටී.විජයකුමාර් මහතා | නියෝජ්‍ය ලේඛකාධිකාරි |
| 4. එස්.තිරුවරුඩ්චෙල්වන් මහතා | වැඩ බලන සහකාර අභ්‍යන්තර විගණක |
| **ඇ) නිරීක්ෂකයෝ** | |
| 5. එස්.මුරුගුපිල්ලෙයි මහතා | කණ්ඩායම් නිළධාරි/විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| 6. එම්.ජේ.ආර්.බෝගමුව මහතා | අභ්‍යන්තර විගණක, විවිප්‍රකොස |
| **ඉ) ආරාධිතයා** | |
| 7. එස්.කේ.ජයවර්ධන මහතා | වැඩ බලන ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි |

## 3. රැස්වීම්

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංකං: පීඊඩී/31, අනුව කමිටුව වසරකට අවම වශයෙන් 4 වතාවක් රැස්විය යුතුය. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කමිටුව 3 වතාවක් පමණක්ම රැස්වීමට හැකිව තිබුණි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා ආයතනයේ ප්‍රථම පාලක මණ්ඩලය රැස්වූයේ 2015 ජූනි මස 11 වන දින බැවින් පාලක මණ්ඩලයේ සාමාජිකයන් පත් නොකිරීම නිසා පළමු කාර්තුව සඳහා වූ රැස්වීම පැවැත්වීමට නොහැකි විය. රැස්වීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රැස්වීම් අංකය | රැස්වූ දිනය |
|---|---|---|
| 1 | 12 වන | 21.07.2015 |
| 2 | 13 වන | 14.10.2015 |
| 3 | 14 වන | 28.11.2015 |

## 4. වසර තුළදී වූ ක්‍රියාකාරකම්:

කමිටුවේ නිර්දේශ අනුමත කිරීම සඳහාත් අවශ්‍ය කටයුතු කිරීම සඳහාත් ආයතනයේ පාලක මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂයේදී පහත සඳහන් ක්‍රියාකටයුතු කමිටුව විසින් සිදු කරන ලදී.

**(අ) අභ්‍යයන්තර විගණනය:**

- අභ්‍යයන්තර විගණන සැලැස්ම හා වැඩසටහන් නිර්දේශ කිරීම සහ අධීක්ෂණය කිරීම
  කමිටුව විසින් 2015 වසර සඳහාවූ විගණන සැලැස්ම හා වැඩසටහන් නිර්දේශ කළ අතර අවුරුද්ද පුරා එහි තත්ත්වය ගැනද නිරීක්ෂණය කරනු ලැබිණ.
- අභ්‍යයන්තර විගණන කටයුතු සමාලෝචනය කිරීම හා අධීක්ෂණය කිරීම
  අභ්‍යයන්තර විගණකගේ වාර්තා, යොමු සටහන් සහ විමසුම් කමිටුව විසින් සමාලෝචනය කර එහි පෙන්නුම් කළ දෝෂ නිවැරදි කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ හා උපදෙස් පරිපාලනයට ලබා දෙන ලදී.

(ආ) **වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම්**

සමාලෝචනයට භාජනයවූ වර්ෂය සඳහාවූ වාර්ෂික වාර්තා පිළියෙළ කිරීමේ ප්‍රගතිය කමිටුව විසින් නිරීෂණය කරනු ලැබූ අතර එය කාලානුරූපව ඉදිරිපත් කිරීමද තහවුරු කළ යුතුය. එමෙන්ම ආයතනයේ ගිණුම් පිළිබඳව වාර්ෂික ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීමද එපරිදිම කටයුතු කළ යුතුව තිබුණි.

(ඇ) **බාහිර විගණනය**

බාහිර විගණකවරුන් විසින් සමාලෝචනය කරන ලද වර්ෂය සඳහා අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලවීමේ තත්ත්වය මත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් හා වාර්ෂික වාර්තා කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබිණ.

(ඈ) **අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය හා අධීක්ෂණය කිරීම**

- වාර්ෂික විශ්ලේෂණය හා ස්ථාවර වත්කම් ලේඛණය

  ආයතනයේ වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය කාලානුරූපව අවසන් කිරීම සඳහා එහි ප්‍රගතිය කමිටුව විසින් අඛණ්ඩව සමාලෝචනය කර අධීක්ෂණය කරනු ලැබිණ. තවද ස්ථාවර වත්කම් මෘදුකාංග නිම කිරීම සඳහා අවශ්‍ය උපදෙස් සපයා අධීක්ෂණය කරන ලදී.

- නිරවුල් නොකරන ලද අත්තිකාරම් හා ණය ආපසු අයකර ගැනීම

  අත්තිකාරම් හා ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලිය ගැන කමිටුව සැළකිලිමත් වූ අතර සමාලෝචිත වසරේ නිරවුල් කිරීමේ ක්‍රියාවලිය සමීපව අධීක්ෂණය කරනු ලැබිණ. තවද නිරවුල් නොකරන ලද අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා නිසි අභ්‍යන්තර පාලනය පවත්වා ගෙන යාමට හැකිවන පරිදි කමිටුව විසින් අවශ්‍ය නිර්දේශ සපයන ලදී.

(ඉ) සංයුක්ත සැළැස්ම හා ප්‍රධාන සැළැස්ම

සංයුක්ත සැළැස්ම හා ප්‍රධාන සැළැස්ම ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කිරීමේ ප්‍රගතිය කමිටුව විසින් අඛණ්ඩව සමාලෝචනය කර අධීක්ෂණය කරන ලද අතර එපරිදිම ඒවා ඉදිරිපත් කිරීමටද ක්‍රියා කළ යුතුව ඇත.

**5. නිගමණය:**

කමිටු සාමාජිකයින්ගේ ක්‍රියාකාරි සහභාගිත්වය හා ආයතනයේ යහපාලනය කෙරෙහි ඔවුන්ගේ කැපවීම පිළිබඳව විගණන කමිටුව සෑහීමකට පත් විය. වැඩ බලන සහකාර අභ්‍යන්තර විගණක, කමිටුවේ ලේකම්වරයා ලෙස තම කාර්ය භාරය ඉටු කරන බවට කමිටුවට හැඟුණි. කමිටුව විසින් කරන ලද නිර්දේශයන්වලට අනුව ගනු ලැබූ ක්‍රියාමාර්ග හා ඒවායේ ප්‍රගතිය පිළිබඳව කමිටුව සෑහීමට පත් විය.

**සභාපති**<br>
**විගණන කමිටුව**<br>
**ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය**

ඇමුණුම් (අ)

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. ENP/BT/C/SVIAS/01/15/05 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 16 May 2017

DIRECTOR'S OFFICE
23 JUN 2017
Swami Vipulananda Institute
Aesthetic Studies

Director,

Swami Vipulananda Institute of Aesthetic Studies

**Report of the Auditor General on the Financial Statements of the Swami Vipulananda Institute of Aesthetic Studies (SVIAS) for the year ended 31 December 2015 in terms of Sub - Section 108(1) of the Universities Act, No.16 of 1978.**

---

Reference to my letter of even number dated 26 January 2017 on the above subject.

02. The above mentioned report is sent herewith.

W.Premananda

Deputy Auditor General

For Auditor General

DR / SVIAS

Copies : 1. Secretary, - Ministry of Higher Education and Highways

2. Secretary, - Ministry of Finance

3. Chairman - University Grant Commission

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මගේ අංකය / எனது இல. / My No. : ඊඑන්පී/බීටී/සී/එස්වීඅයිඒඑස්/01/15/05 ඔබේ අංකය / உமது இல. / Your No. : දිනය / திகதி / Date : 2017 ජනවාරි 26 දින

අධ්‍යක්ෂ,
සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනය
මඩකලපුව.

**සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ (SVIAS) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107(5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්ව විද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල් ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී

ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) එවකට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් රු. 11,450,000 ක් වටිනා මෝටර් වාහන 02 ක් එහි අයිතියද සමග 2012 වර්ෂයේදී ආයතනයට පරිත්‍යාග කර තිබුණි. කෙසේ වුවද එම වාහනවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ආයතනයේ සිසුන් සඳහා රු. 201,300,000 ක් වටිනා නේවාසිකාගාර ගොඩනැගිල්ලක් සමාලෝචිත වර්ෂයේදී ඉදිකර භාර දී තිබුණි. කෙසේ වුවද මෙම ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුවන්ට කරන ලද ගෙවීම් වලින් අඩු කර ගන්නා ලද රු. 1,793,660 ක්වූ රඳවා ගැනීම් මුදල් ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ගොඩනැගිල්ලේ මුළු පිරිවැය මෙන්ම බැරකම්ද සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | මුදල | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 40,983,947 | ස්ථාවර වත්කම් ලේඛනය හා සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 21,006,476 | |
| ලී බඩු හා කාර්යාල උපකරණ | 23,297,515 | |
| සුභසාධන භාණ්ඩ | 1,767,762 | |

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය** | |
| (i) X පරිච්ඡේදය 20.6 වගන්තිය | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ලබාගන්නා ලද වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර පොදු ආකෘති 96 මගින් මාසිකව විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |
| (ii) XXVII පරිච්ඡේදය 3.1 වගන්තිය | ආයතනය විසින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම වාර්තා කිරීම සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 104 | ආයතනයට අයත් මෝටර් වාහන 3 ක් අනතුරුවලට භාජනය වී තිබූ අතර එකතුව රු. 1,171,872 ක් වූ අලුත්වැඩියා කිරීමේ පිරිවැය සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. කෙසේ වුවද, ඒ පිළිබඳ ප්‍රමාණය තහවුරු කර ගැනීමට හා පාඩුවලට හේතු සහ වගකීම් නියම කිරීම සඳහා විමර්ශනයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු. 4,015,938 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු. 16,919,352 ක ඌනතාවයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 20,935,290 ක වර්ධනයක් දැක්වුණි. පෙර වර්ෂයට සාපේක්ෂව රු. 62,900,000 කින් රජයේ ප්‍රදාන වැඩිවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 ආයතනයේ අගය එකතු කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා අතිරික්තය රු. 4,015,938 ක් වුවද සමාලෝචිත වර්ෂය තුළ ආයතනයෙන් රටට වූ දායකය රු. 101,299,224 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ හා පෙර වර්ෂ 4 ක් සඳහා ආයතනයෙන් රටට වූ දායකය පහත පරිදි වේ.

| | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' |
| අතිරික්තය/ (ඌනතාවය) | 4,016 | (16,919) | (2,387) | 3,574 | (1,935) |
| එකතු කළා | | | | | |
| * පුද්ගලික පඩිනඩි | 88,531 | 56,175 | 42,918 | 32,873 | 28,770 |
| * රජයටගෙවන ලද බදු එකතු කළ අගය මත බදු (වැට්) | 1,712 | 1,017 | 1,497 | - | - |
| * ක්ෂය | 7,040 | 6,225 | 4,254 | 3,783 | 2,545 |
| * මුළු දායකය | 97,283 | 63,416 | 48,668 | 36,656 | 31,315 |
| අගය එකතු කිරීම | 101,299 | 46,497 | 46,282 | 40,230 | 29,380 |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ අධ්‍යයන කාර්ය සාධනය පහත පරිදි වේ.

#### (අ) උපාධි පාඨමාලා

පසුගිය වර්ෂ 3 තුළ එක් එක් දෙපාර්තමේන්තුව සඳහා බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව පහත දැක්වේ.

| දෙපාර්තමේන්තුව | බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2015 | 2014 | 2013 |
| කර්නාටික් සංගීතය | 79 | 68 | 67 |
| නැටුම් | 49 | 46 | 39 |
| නාට්‍ය හා රංගන කලා | 33 | 25 | 31 |
| දෘශ්‍ය හා තාක්ෂණික කලා | 44 | 46 | 45 |
| **එකතුව** | **205** | **185** | **182** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ කර්නාටික් සංගීත දෙපාර්තමේන්තුව, නැටුම් දෙපාර්තමේන්තුව හා නාට්‍ය හා රංගන කලා දෙපාර්තමේන්තුවට සිසුන් බඳවා ගැනීම පිළිවෙලින් සියයට 18 කින්, සියයට 26 කින් හා සියයට 6 කින් වැඩි වී තිබූ අතර, 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ දෘශ්‍ය හා තාක්ෂණික කලා දෙපාර්තමේන්තුවට සිසුන් බඳවා ගැනීම සියයට 2 කින් අඩු වී තිබුණි.

#### (ආ) විභාග ප්‍රතිඵල

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ අවසාන විභාග පැවැත්වීම හා විභාග සමත් වූ සිසුන් සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තර | කර්නාටික් සංගීත දෙපාර්තමේන්තුව | | නැටුම් දෙපාර්තමේන්තුව | | නාට්‍ය හා රංගන කලා දෙපාර්තමේන්තුව | | දෘශ්‍ය හා තාක්ෂණික කලා දෙපාර්තමේන්තුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2015 | 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 | 2014 |
| සමාලෝචිත වර්ෂය තුළ අවසාන විභාග වලට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව | 60 | 36 | 30 | 30 | 35 | 42 | 45 | 46 |
| විභාග සමත් වූ සිසුන් සංඛ්‍යාව | 48 | 36 | 30 | 30 | 35 | 42 | 43 | 46 |
| විභාගවලට පෙනී සිටි මුළු සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස විභාග සමත් වූ සිසුන් සංඛ්‍යාව | 80 | 100 | 100 | 100 | 100 | 100 | 96 | 100 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

අවසාන විභාගයට පෙනී සිටි කර්නාටික් සංගීත දෙපාර්තමේන්තුවේ හා දෘශ්‍ය හා තාක්ෂණික කලා දෙපාර්තමේන්තුවේ පිළිවෙලින් සිසුන් 60 ක් හා සිසුන් 45 ක් අතුරින් ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණය වැනි විෂයයන් අසමත් වීම හේතුවෙන් අවසාන විභාගය සඳහා පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 20 ක් හා සියයට 04 ක් නියෝජනය වන පරිදි සිසුන් 12 ක් හා සිසුන් 2 දෙනෙක් විභාගය අසමත් වී තිබුණි.

(ඇ) **ඒක ශිෂ්‍ය පිරිවැය**

සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂ තුනක් සඳහා ආයතනයේ ලියාපදිංචි වූ මුළු සිසුන් සංඛ්‍යාව හා ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

| | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|
| මුළු පිරිවැය (රු'000) | 134,412 | 93,807 | 72,022 | 54,285 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 1052 | 1031 | 997 | 923 |
| ඒක ශිෂ්‍ය පිරිවැය (රු'000) | 128 | 91 | 72 | 59 |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයේ ඒක ශිෂ්‍ය පිරිවැය සියයට 29 කින් වැඩි වී තිබුණි.

### 4.2 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

සිසුන්ට නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් 2013 අගෝස්තු සිට 2015 මාර්තු දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.50,000 ක මාසික කුලියකට කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගැනීමට ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද මෙම ගොඩනැගිල්ලේ අයිතිකරු කළමනාකරණ මණ්ඩලයේ එක් සමාජිකයකු වන හෙයින් ලැදියාව පිළිබඳ ගැටුම සැලකීමෙන් තොරව ආයතනය විසින් මෙම ගොඩනැගිල්ල ලබා ගෙන තිබුණි.

### 4.3 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ලබා ගන්නා ලද නිවාඩු වාර්තා කිරීමට හැකිවන පරිදි නිවාඩු ලේඛනයක් පවත්වා ගැනීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ X පරිච්ඡේදයේ 23 වගන්තිය ප්‍රකාරව ආයතනය කටයුතු කර නොතිබුණි.

(ii) යළි පිබිදෙන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් යතුරු පැදි දෙකක් ඒවායේ අයිතිය සමග 2015 මැයි 25 දින ආයතනයට පරිත්‍යාග කර තිබුණි. කෙසේ වුවද ආයතනය විසින් දින 101 ක ප්‍රමාදයක් සහිතව 2015 සැප්තැම්බර් 21 දින මාරු කිරීමේ ඉල්ලුම්පත්‍ර මෝටර් ප්‍රවාහන කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර තිබුණි. ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමට ප්‍රමාදවීම හේතුවෙන්, මේ සම්බන්ධයෙන් රු. 20,200 ක මුදලක් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයාට ගෙවීමට ආයතනයට සිදු වී තිබුණි.

(iii) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව, නිලධාරීන් සංඛ්‍යාව 25 ක් ඉක්මවන්නේ නම් නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම වාර්තා කිරීම සඳහා ඇඟිලි සටහන් ස්කෑනර් යන්ත්‍රයක් යොදා ගත යුතුය. කෙසේ වුවද ආයතනයේ නිලධාරීන් සංඛ්‍යාව 93 ක් වුවද ආයතනය විසින් ඇඟිලි සටහන් ස්කෑනර් යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි.

(iv) ආයතනය විසින් එකතු කළ අගය මත බදු සියයට 11 ක රේටයට ගණනය කරනු වෙනුවට 2014 දෙසැම්බර් මාසය සඳහා ගෙවන ලද රු. 900,259 ක ආරක්ෂක ගෙවීම් මත එකතු කළ අගය මත බදු සියයට 12 ක රේටයට ගණනය කර රු.108,031 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු. 9,003 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට වැඩිපුර ගෙවා තිබුණි. කෙසේවුවද, කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවන ලද මුදල 2016 ඔක්තෝබර් 13 වන විටත් අයකර ගෙන නොතිබුණි.

(v) ආයතනයට ආරක්ෂක සේවා සපයන ආයතනය විසින් 2014 නොවැම්බර් හා 2015 අගෝස්තු මාස සඳහා ලබාදෙන ලද ආරක්ෂක සේවා සඳහා රු. 1,497,568 මුදලක් ඉල්ලා තිබුණි. කෙසේ වුවද අදාළ සමාගම විසින් කරන ලද ඉල්ලීම සැලකීමෙන් තොරව ආයතනය විසින් රු.1,531,618 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවන ලද රු. 34,050 ක මුදල අයකර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

(vi) සංගීත, නැටුම්, නාට්‍ය හා රංගනකලා දෙපාර්තමේන්තුවල බිත්ති අල්මාරි සඳහා සවි කිරීමට 2015 දෙසැම්බර් මාසයේදී සැපයුම්කරුවෙකු විසින් සපයන ලද රු. 385,246 ක් වටිනා වීදුරු හා සවි කිරීම් ද්‍රව්‍ය අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව 2016 ඔක්තෝබර් 13 දක්වා නිෂ්කාර්යව පැවතුණි.

(vii) 2014 නොවැම්බර් 11 දින නැටුම් පීඨයේ ගබඩාවේ සිදු කරන ලද භෞතික සත්‍යාපනයේදී රු. 920,621 ක් වටිනා තොග විෂයයන් 38 ක ඌනතාවයක් අනාවරණය විය. කෙසේවුවද, එම විෂයයන් අස්ථානගත පිළිබඳ වගකිව යුතු නිලධාරින්ට එරෙහිව ආයතනය විසින් 2016 ඔක්තෝබර් 13 දක්වාත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(viii) සේවය තහනම් කරන ලද නිලධාරින් තිදෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.493,454 ක සේවක ණය ශේෂයන් වර්ෂ 04 කට වැඩි කාලයක් හිඟහිට පැවතුණි. කෙසේවුවද එම හිඟ ශේෂයන් ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට 2016 ජූනි 30 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ix) නිලධාරීන් 04 දෙනෙකුට ගෙවන ලද එකතුව රු. 14,393 ක්වූ අත්තිකාරම් අදාළ නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 04 කට වැඩි කාලයක් පැවතුණි.

(x) පශ්චාත් උපාධි සම්පූර්ණ නොකිරීම හේතුවෙන් සේවය නතර කරන ලද කථිකාචාර්යවරුන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.650,156 ක මුදලක් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව හිඟ හිට පැවතුණි.

## 4.4 නිවාස සඳහා කල්බදු ගෙවීම

-------------------------------

ආයතනයේ සිසුන්ට නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් 2008 වර්ෂය සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය සඳහා ආයතනය අවට පිහිටා ඇති නිවාස 10 ක් ආයතනය විසින් කල්බදු පදනම මත ලබා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 835 ප්‍රකාරව තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් තොරව රු. 20,000 ක හා රු. 30,000 ක මාසික බදු මුදලකට පිළිවෙලින් 2008 වර්ෂයේදී හා 2011 වර්ෂයේදී නිවාස හිමියන් දෙදෙනෙකු සමග ආයතනය ගිවිසුම්වලට එළඹ තිබුණි.

(ii) ආයතනයේ අධ්‍යක්ෂ හා අදාළ දේපලවල හිමිකරුවන් අතර ඉහත සඳහන් බදුකුලී ගිවිසුම් අත්සන් කර තිබුණද, ලියකියවිලි ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 17 වගන්තිය ප්‍රකාරව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ රෙජිස්ට්‍රාර් වෙත මෙම බදු කුලී ගිවිසුම් ලියාපදිංචි කර නොතිබුණි.

## 4.5 අධ්‍යයන කටයුතු

-------------------

සමාලෝචිත වර්ෂය තුළ කර්නාටික් සංගීත දෙපාර්තමේන්තුවේ අවසාන වර්ෂයේ සිසුන්ගේ පළමු අර්ධ වර්ෂය සඳහා විෂයයන් 07 ක් වෙනුවෙන් දේශන පැය 690 ක් ආයතනය විසින් වෙන් කර තිබුණි. කෙසේවුවද, වෙන් කරන ලද මුළු පැය ගණනින්, දේශන පැය 297 ක් පමණක් ස්ථිර හා බාහිර කථිකාචාර්යවරුන් විසින් සම්පූර්ණ කර තිබුණි. ඒ අනුව, මුළු දේශන පැය ප්‍රමාණයෙන් සියයට 57 ක් සම්පූර්ණ කිරීමෙන් තොරව අදාළ සිසුන් අවසාන විභාගයට පෙනී සිට තිබුණු අතර අදාළ විෂයයන්හි ප්‍රමාණවත් දැනුමක් ලබා ගැනීමෙන් තොරව උපාධි සහතික ලබා ගැනීමට මෙම පරිචය ඉඩ ලබා දී තිබුණි. විස්තර පහත දැක්වේ.

| විෂයය | වෙන් කරන ලද මුළු පැය ගණන | සම්පූර්ණ කරන ලද මුළු පැය ගණන | සම්පූර්ණ නොකරන ලද මුළු පැය ගණන |
| --- | --- | --- | --- |
| ස්වර (vocal) - මනෝකර්ම සංගීතයේ ස්වරූප | 180 | 73 | 107 |
| වීණා - මනෝකර්ම සංගීතයේ ස්වරූප | 180 | 122 | 58 |
| Mirudhangam - මනෝකර්ම සංගීතයේ ස්වරූප | 180 | 55 | 125 |
| සංගීත ඉතිහාසය හා ලායා 7 | 45 | 18 | 27 |
| Mirudhangam - න්‍යාය -7 | 45 | 16 | 29 |
| පර්යේෂණ ක්‍රමවේදය | 30 | 07 | 23 |
| සංගීතය හදාරන සිසුන්ට සංස්කෘත භාෂාව | 30 | 06 | 24 |
| | 690 | 297 | 393 |

## 4.6 අරමුදල් ඌන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රාග්ධන වැඩ 07 ක් සිදු කිරීම සඳහා 2013 වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රදාන යටතේ වෙන් කරන ලද එකතුව රු. මිලියන 10.83 ක අරමුදල් අදාළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව 2016 ඔක්තෝබර් 13 දක්වා බැංකු ජංගම ගිණුමක තබා තිබුණි.

(ii) තොරතුරු හා සන්නිවේදන සංවර්ධන ව්‍යාපෘතිය, සිසුන් කේන්ද්‍රකරගත් ඉගෙනීම් ව්‍යාපෘතිය හා පර්යේෂණ ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය ආදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කරන ලද රු. මිලියන 37.75 ක් වූ අරමුදල් අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කිරීමෙන් තොරව 2014 වර්ෂයේ සිට බැංකු ජංගම ගිණුමක තබා තිබුණි.

## 4.7 අර්ධ - ස්ථිර දේශන ශාලා 3 ක් ඉදිකිරීම.

විධිමත් ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීමෙන් තොරව 2013 වර්ෂයේදී රු. 10,708,750 ක කොන්ත්‍රාත් වටිනාකමට සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ අර්ධ - ස්ථිර දේශන ශාලා ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් නැගෙනහිර විශ්ව විද්‍යාලය විසින් ප්‍රදානය කර තිබුණි. කෙසේවුවද, වාතාශ්‍රය නොමැතිවීම හේතුවෙන් මෙම දේශනා ශාලා

භාවිතා කිරීම සිසුන් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් මෙම දේශනා ශාලා ඉදිකිරීම් දිනයේ සිටම ඌන උපයෝජිතව පැවතුණි.

4.8 මානව සම්පත් කළමනාකරණය

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගබඩා භාරකරු තනතුර 2012 ජූලි 02 දින සිට පුරප්පාඩු වී පැවතුණි. කෙසේවුවද මෙම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කිරීමෙන් තොරව ඉහත තනතුරේ රාජකාරි නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ගබඩා භාරකරු විසින් වැඩ බැලීමේ පදනම මත ඉටු කර තිබුණි.

(ආ) කථිකාචාර්ය පරිවාස තනතුර හා ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික නිලධාරි තනතුර 2013 ජනවාරි 01 දින සිට පුරප්පාඩු වී පැවතුණි. කෙසේවුවද මෙම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා තාවකාලික කථිකාචාර්යවරුන් 13 දෙනෙකු ආයතනය විසින් බඳවා ගෙන තිබුණි.

5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

---

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/02 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතුය. කෙසේවුවද සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන මාස 04 ක ප්‍රමාදයකින් පසුව 2016 ජූනි 10 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම

---

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) හා 4.2.3 වගන්ති ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 3 ක කාල පරිච්ඡේදයක් ඇතුළත සම්පූර්ණ කිරීමට අපේක්ෂිත කාර්යයන් ඇතුළත්ව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

---

ක්‍රමවත් හා විෂය නිශ්චිත ප්‍රවේශයක් භාවිතා කරමින් අවදානම් කළමනාකරණය, යහපාලනය හා පාලන කාර්යයන් වැඩි දියුණු කිරීම සහ ඇගයීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතු වුවද, 2005 වර්ෂයේ සිට ආයතනයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. කෙසේවුවද ආයතනයේ පුරප්පාඩු වී පවතින අභ්‍යන්තර විගණක තනතුරෙහි වැඩ බැලීම රාජකාරි කිරීම සඳහා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර විගණකට රු. 143,110 ක වැඩ බැලීමේ දීමනාවක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි.

## 5.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

---

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013 අප්‍රේල් 10 දිනැති අංක 04/2013 දරන ආයතන චක්‍රලේඛ ලිපිය අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර, ඒ පිළිබඳ වාර්තා 2016 මාර්තු 17 දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, ආයතනය විසින් 2016 ජූනි 30 දක්වාත් භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | | | |
|---|---|---|---|
| (අ) | වත්කම් පිළිබඳ පාලනය | - | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීම හා භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම. |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | - | ප්‍රමාණ කළ අලාභ අයකර ගැනීම, කොන්ත්‍රාත් ගිවිසුම්වල කොන්දේසි වලට අනුකූල වීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

**1978 අංක: 16 දරණ විශ්ව විද්‍යාල පණතේ 108 (1) උප වගන්තිය අනුව 31, දෙසැම්බර් 2015 දින අවසන් වූ වර්ෂය සඳහා ස්වාමි විපුලානන්ද සෞන්දර්යය අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපතිගේ වාර්තාවට කළමණාකරණ ප්‍රතිචාර**

| විගණන ඡේද යොමුව | | නිරීක්ෂණය |
|---|---|---|
| 2.2. මූල්‍ය ප්‍රකාශ මත අදහස් දැක්වීම් | | |
| 2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලවීම | | |
| | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගණකාධිකරණ ප්‍රමිති අංක: 07 අනුව ඉඩම් හා ගොඩනැගිලි අත්පත්කර ගැනීම එකවර සිදු කර ඇතත් ඒවා වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කර තිබිය යුතුය. කෙසේවෙතත්, ආයතනයේ ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වන රුපියල් 40,983,947.00, ඉඩම් හා ගොඩනැගිලි ගිණුමෙහි වටිනාකම වෙන වෙනම පෙන්වා තිබිය යුතු නමුත් ඉඩමේ වටිනාකම වෙනම නොපෙන්වා එකට යොදා පෙන්නුම් කර ඇත. | පිළිගෙන ඇත.<br>ඉඩම් හා ගොඩනැගිලිවල හිමිකම තවමත් ආයතනයට මාරු කර නොමැත. ඉඩම් හා ගොඩනැගිලි මාරුකිරීම සඳහා කටයුතු කරමින් පවතී. හිමිකම ලබාගත් විගස තක්සේරුව සඳහා කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගණකාධිකරණ ප්‍රමිතී අංක: 07 අනුව මූල්‍ය වාර්තාවේ ඉඩම් හා ගොඩනැගිලි වෙන වෙනම ප්‍රකාශ කරනු ලැබේ. |
| 2.2.2. ගිණුම්කරණ ප්‍රතිපත්ති | | |
| | ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව වසරේ වත්කම් එකතු කිරීමේදී ඌණතා සඳහා අයකර ගනු නොලැබේ. කෙසේවෙතත්, සමාලෝචිත වසරේ පාර තනා වසර අවසානයේ නිම කිරීම සඳහා ඌණතාවය ලෙස රුපියල් 150,000.00 ක මුදල් ප්‍රමාණයක් අය කර ඇත. | පිළිගෙන ඇත.<br>මෙය 2016 මූල්‍ය ප්‍රකාශයේ නිවැරදි කරනු ලැබේ. |
| 2.2.3. ගිණුම්කරණ ඌණතා | | |
| (අ) | 2012 වසරේදී මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් රුපියල් 11,450,000.00 ක් වටිනා වාහන දෙකක් හිමිකමද පවරා ආයතනයට පරිත්‍යාග කරන ලදී. කෙසේවෙතත්, මෙම වාහනවල වටිනාකම ගිණුම්වලට ගෙන නොතිබුණි. | පිළිගෙන ඇත.<br>මෙම වාහන දෙකෙහි වටිනාකම 2016 ගිණුම් පොත්වලට ගනු ලැබේ. |
| (ආ) | සමාලෝචිත වසරේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රුපියල් 2001,300,000.00 ක් වටිනා ශිෂ්‍යයන් සඳහා වූ නේවාසිකාගාර ගොඩනැගිල්ලක් තනා ආයතනයට භාරදෙන ලදී. කෙසේවෙතත්, මෙම ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්වලට ගෙන නොතිබුණි. | පිළිගෙන ඇත.<br>මෙම නේවාසිකාගාර ගොඩනැගිල්ලේ වටිනාකම 2016 ගිණුම් පොත්වලට ගනු ලැබේ. |
| (ඇ) | කොන්ත්‍රාත් ගෙවීම්වලින් අය කර ගත් රුපියල් 1,843,659.00ක රඳවා තැබීමේ මුදල් ප්‍රමාණය ගිණුම්වලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ගොඩනැගිල්ලේ සම්පූර්ණ පිරිවැය සමාන ප්‍රමාණයකින් අඩු කර පෙන්වා ඇත. | පිළිගෙන ඇත.<br>2016 වසර සඳහාවූ මූල්‍ය ප්‍රකාශයේ මෙය නිවැරදි කරනු ලැබේ. |
| (ඇ) | සමාලෝචිත වසර තුළ විගණන ගාස්තු හා පාරිතෝෂිකය සඳහා වූ රුපියල් 5,231,838,00 ක මුදල් එකතුව, මුදල් පරිහරණය හා සබැඳියාවක් නොමැති නමුත් විෂයයක් ලෙස නොසළකා එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන විෂයයන්ගේ වෙනස්කම් ලෙස පෙන්වා ඇත. | සටහන් කර ඇත.<br>2015 වසර තුළ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වූ පාරිතෝෂික ප්‍රතිපාදන ප්‍රමාණය වන රුපියල් 5,231,838,00 ක මුදල ඉදිරිපත් කිරීමේ දෝෂය නිවැරදි කළ අතර ලබන මුදල් වසරේදී විගණන ගාස්තු සඳහා වූ විධිවිධාන නිවැරදි කරනු ලබේ. |
| 2:2:4 විගණන සඳහා සාක්ෂි හිඟකම | | |

| | | | |
|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි - රු. 40,983,947<br>යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ - රු.21,006,476<br>ලී බඩු හා කාර්යාල උපකරණ - රු.23,297,515<br>සුභසාධන භාණ්ඩ- රු.1,767,762 | | | පිළිගැනේ.<br>ස්ථාවර වත්කම් ලේඛණයේ මෘදුකාංගය ස්ථාපනය කරන ලද අතර BDO කොටස්කරුවන් විසින් කාර්ය මණ්ඩලය පුහුණු කරනු ලැබීය. කාර්යයන් යාවත්කාලීන කිරීමේ කටයුතු කෙරෙමින් පවතී. |
| ණය හා අත්තිකාරම් - රු.7,751,042 | | | ආයතනයේ මුදල් අංශයේ ණය හා අත්තිකාරම් ලේඛණය නඩත්තු කරනු ලැබේ. |
| 2:2:5. නීතිරීති රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම | | | |
| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
| (අ) | උසස් අධ්‍යාපන ආයතනවලට හා විශ්ව විද්‍යාල කොමිසම් සභාව සඳහා ආයතන සංග්‍රහය | | |
| (i) | X පරිච්ඡේදයේ 20.6 වන වගන්තිය | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වැටුප් රහිත නිවාඩු පිළිබඳ තොරතුරු මාසිකව පොදු: 96 ආකෘති පතෙහි විගණකාධිපතිවෙතට දන්වා නොමැත. | පිළිගැනේ.<br><br>අනාගතයේදී මෙම කරුණ නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | XXVII X පරිච්ඡේදයේ 3:1 වන වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම වාර්තා කිරීම සඳහා ආයතනය විසින් පැමිණීමේ ලේඛණයක් නඩත්තු කර නොමැත. | පිළිගැනේ.<br>සම්ප්‍රදායක ලෙස අනෙක් විශ්ව විද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩල මෙන් ඔවුන්ගේ පැමිණීම වාර්තා කරනු නොලැබේ. |
| | 1978 අංක: 16 දරණ විශ්ව විද්‍යාල පණතේ 109 වගන්තිය | 2013 හා 2014 වර්ෂ සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශ සහ විගණකාධිපතිගේ වාර්තාව 2016 ජූනි මස 30 දිනට පවා රජයේ ගැසට් පත්‍රයේ පළ කර නොමැත. | 2013 හා 2014 වර්ෂ සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශ විගණකාධිපතිගේ වාර්තාව සමඟ 2016 ජනවාරි මස 22 වනදා රජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) | මුරෙ 104 | ආයතනයට අයත් වාහන තුනක් අනතුරට පත් වී ඇති අතර සමාලෝචිත වසර තුළ රුපියල් 1ල171ල872 ක මුදලක් අළුත් වැඩියාව සඳහා වියදම් කර ඇත. කෙසේ වුවද පරීක්ෂණයක් පවත්වා එහි පාඩුවේ ස්වභාවය හා ඊට හේතුව කුමක්දැයි නිශ්චය කිරීම සඳහා පරීෂණයක් පවත්වා නොමැත. | පිළිගැනේ.<br>අනතුර සිදුවූ අවස්ථාවේදී පොලීසියට වාර්තා කර ඇති අතර රක්ෂණ සංස්ථාවෙන් වන්දි ගෙවීම සඳහා ඉල්ලා ඇත.<br>මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කමිටුවක් පත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| 3. මූල්‍ය සමාලෝචනය<br>3.1 මූල්‍ය ප්‍රතිඵල | | |
| ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව සමාලෝචිත වසරේ ආයතනයේ ක්‍රියාකාරම්වලට අනුව රුපියල් 4,015,938 ක අතිරික්තයක් ඇති කළ අතර එය පූර්ව වසරට සාපේක්ෂව රුපියල් 16,919,152 කින් අනුරූපි වූ හිඟය මූල්‍ය ප්‍රතිඵලවල රුපියල් 20,935,290 ක වර්ධනයක් ලෙසින් පෙන්නුම් කරනු ලැබිණ. මීට පෙර වසර හා සසඳන කල්හි රුපියල් 62,9000 ක රජයේ ප්‍රදානයක් වැඩි කිරීමෙන් ප්‍රධාන වශයෙන් මෙම වර්ධනය සඳහා හේතු ගැන්වේ. | | සටහන් කර ඇත. |
| 4. මෙහෙයුම් සමාලෝචනය<br>4.1.කාර්ය සාධනය | | |
| (අ) උපාධි පාඨමාලා | | |
| | පසුගිය වර්ෂ තුනක් තුළ එක් එක් දෙපාර්තමේන්තුව සඳහා ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් ඇතුළත් කිරීමේ ප්‍රතිපත්ති තීරණය කරන ලදී. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් දෙන ලද ප්‍රතිපාදන මත එක් එක් පාඨමාලාවන් සඳහා සිසුන් ලියා පදිංචි වූහ. |
| (ඇ) විභාග ප්‍රතිඵල | | |
| | පූර්ව වසර හා සසඳන ලද පරිදි සමාලෝචිත වසරේ පවත්වන ලද අවසාන පරීක්ෂණ හා සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යා තොරතුරු දැක්වේ. | සිසුන්ගේ කාර්ය සාධනය අනුව විභාග සමත්වීමේ අනුපාතය නිර්නය කරනු ලැබේ. |
| (ඇ) | ශිෂ්‍යයෙකුට වියදම | |
| | පූර්ව වසර හා සංසන්දනය කළ විට සමාලෝචිත වසරේ ආයතනයේ සිසුවෙකුගේ වියදම 29% කින් වැඩි කරන ලදී. | සටහන් කර ඇත. |
| (ඉ) | පර්යේෂණ දීමනා ගෙවීම | |
| | ඉදිරිපත් කරන ලද පර්යේෂණ යෝජනා අනුව පර්යේෂණ කමිටුව විසින් අනුමත කරන ලද පරිදි පර්යේෂණ දීමනා වන එකතු මුදලක් වූ රුපියල් 1,265,229.00 ක් ලබා ගත් කථිකාචාර්යවරුන් 09 දෙනා 2015, දෙසැම්බර් මස 31 වන දිනට පෙර පර්යේෂණ වැඩ නිම කළ යුතුය. නමුත්, එම කථිකාචාර්යවරුන් 2016 ඔක්තෝබර් 13 දින තෙක් පර්යේෂණ වැඩ නිම කර නොමැත. | 2015 දී පර්යේෂණ දීමනා ලබාගත් එම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 2016 වසරේදී පර්යේෂණ ප්‍රගතිය සමඟ ඔවුන්ගේ නව යෝජනාද ඉදිරිපත් කර ඇත. |
| 4.2. තර්ක ස්වභාවයේ ගණුදෙණු | | |
| | සිසුන් සඳහා නවාතැන් පහසුකම් සැළසීම සඳහා මාසික කුලී ගාස්තු පදනමක් මත මාසික කුලිය රුපියල් 50,000.00 ක් ගෙවන පරිදි 2013 අගෝස්තු මස සිට 2015 මාර්තු දක්වාවූ කාල පරිච්ඡේදයක් සඳහා ගොඩනැගිල්ලක් ලබා ගැනීමට ආයතනයේ කළමණාකරණ මණ්ඩලය විසින් අනුමැතිය දී ඇත. කෙසේනමුත් මෙම ගොඩනැගිල්ලේ හිමිකරු, කළමණාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු වූ බැවින් අවශ්‍යතා පිළිබඳව සළකා ගැටුමකින් තොරව ආයතනය විසින් ගොඩනැගිල්ල ලබාගෙන ඇත. | පිළිගැනේ.<br>ආයතනයට සමීපවම පිහිටා ඇති සියළු පහසුකම්වලින් යුක්තවූ සිසුන් 60 කුට නවාතැන් සැළසිය හැකි එකම ගොඩනැගිල්ල මෙය විය. මෙය සොහොයුරියන්ට අයත් නිවසක් බැවින් කළමණාකරණ මණ්ඩලයේ සාමාජියෙකු වන මීසමේ පූජකතුමා විසින් ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙය මූල්‍ය වාර්තාවේ අදාළ පාර්ශවයේ ගණුදෙණු යටතේ අනාවරණය කරනු ඇත. |

| 4.3. පාලන අකාර්යක්ෂමතාවය | | |
|---|---|---|
| (i) | උසස් අධ්‍යාපන ආයතන හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ ආයතන සංග්‍රහයේ X පරිච්ඡේදයේ 23 වන වගන්තිය ප්‍රකාර අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ලබා ගන්නා ලද නිවාඩු පිළිබඳව වාර්තා කිරීමට හැකිවනු පිණිස නිවාඩු ලේඛණය නඩත්තු කිරීමට ආයතනය විසින් කටයුතු කර නොමැත. | ආයතනයේ නිවාඩු වාර්තා නඩත්තු කරගෙන යනු ලැබේ. නිවාඩු ලේඛණය විවිධ හැඩතලයකින් නිර්මාණය කර ඇති නමුත් එහි අවශ්‍ය සියළු තොරතුරු සපයා ඇත්තේය. |
| (ii) | යළි පිබිදීම ව්‍යාපෘතියේ අධ්‍යක්ෂකවරයා විසින් යතුරුපැදි දෙකක් 2015.05.25 දින හිමිකම් හුවමාරුව සමඟ ආයතනයට පරිත්‍යාග කරන ලදී. කෙසේවෙතත්, ආයතනය විසින් මාරු කිරීමේ ආකෘති පත මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්තුමා වෙත 2015 සැප්තැම්බර් මස 21 වනදා 101 ක් දිනක ප්‍රමාදයකින් පසුව ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්තුමා වෙත අයදුම්පත් ප්‍රමාද වී ඉදිරිපත් කළ නිසා රු. 20,020.00 ක මුදලක් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්තුමා වෙතට ගෙවීමට සිදුවිය. | පිළිගැනේ.<br>ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය විසින් යතුරු පැදි භාරගන්නා විට යතුරු පැදිවල ආදායම් බලපත්‍ර භාර නොදෙන ලදී. යළි පිබිදීම ව්‍යාපෘතියේ කාර්යාලය වසා ඇති බැවින් අදාළ නිළධාරියාගෙන් තොරතුරු ලබා ගැනීමට නොහැකි විය. නැවත ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනයේ නිළධාරීන් ත්‍රිකුණාමලය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ගොස් අදාළ ලිපිලේඛණ ලබා හුවමාරු අයදුම්පත සකස් කර ඇත. |
| (iii) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 09/2009 හා 16.04.2009 දිනැති ලිපිය අනුව නිළධාරීන්ගේ සංඛ්‍යාව 25 කට වඩා ඉක්ම වී ඇත්නම් ඇඟිලි සළකුණු ස්කෑන් යන්ත්‍රයක් උපයෝගි කර ගත යුතුව තිබුණි. කෙසේ නමුත් නිළධාරීන්ගේ මුළු සංඛ්‍යාව 93 ක් වූ නමුත් ඇඟිලි සළකුණු ස්කෑන් යන්ත්‍රයක් උපයෝගි කර නො තිබුණි. | පිළිගැනේ.<br>ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතන අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සළකුණු ස්කෑන් යන්ත්‍රය උපයෝගි කරනු ලැබේ. විටින් විට ඇති දෝෂ ඇතිවූ නිසා අළුත්වැඩියා කර ආරක්ෂක අංශයට සමීපව එය මාරු කිරීමට කටයුතු යොදා ඇත. |
| (ix) | සමාලෝචිත වසර සඳහා ආයතනය විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා සියයට 11 ගණනේ VAT ගණනය කළයුතුව තිබූ නමුත් 12 ගණනේ අගය ගණනය කර රුපියල් 900,259 ක ඇප මුදලක් සඳහා රුපියල් 108,031 ක් ගෙවා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් 9,003 ක අමතර මුදලක් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා ඇත. කෙසේවෙතත් කොන්ත්‍රාත්කරුවෙත ගෙවන ලද අමතර මුදල 2016 ඔක්තෝබර් මස 13 වන තෙක් එය අය කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනු නොලැබේ.<br>එවැනි VAT බද්දක් නොමැති බව කරුණාවෙන් සළකන්න. 2014, දෙසැම්බර් මස සඳහා අදාළ බදු අනුපාතය 12% ක් වූ අතර සැපයුම්කරු විසින් 31.12.2014 දිනට අදාළ ඉන්වොයිසිය නිකුත් කර ඇත. VAT පණත ප්‍රකාර VAT මුදලේ වටිනාකම ආයතනය විසින් ගෙවා ඇත. |

| | | |
|---|---|---|
| (v) | ආයතනයට ආරක්ෂක සේවා සළසන සමාගම විසින් රුපියල් 1, 497,568 ක මුදලක් 2014 නොවැම්බර් මස හා 2015 අගෝස්තු මාස සඳහා ආර්ෂක සේවාවන් සඳහා ගෙවන මෙන් ඉල්ලන ලදී.කෙසේවෙතත් අදාළ සමාගම විසින් කරන ලද ඉල්ලීම ගැන නොසළකා ආයතනය විසින් රුපියල් 1,531,618 ක් ගෙවා ඇත. මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවෙත ගෙවන ලද අමතර මුදල වන රුපියල් 34,050 අය කර ගැනීමට ආයතනය විසින් කටයුතු කර නොමැත. | ආයතනයේ දැනට ආරක්ෂා සේවය සපයනු ලබන්නේ එම සැපයුම්කරු විසින්ම නිසා ගෙවීම් කල අමතර මුදල අය කර ගැනීම සඳහා වහා කටයුතු කරනු ලැබේ. |
| (vi) | සංගීත, නැටුම්, නාට්‍ය හා රංග කලා දෙපාර්තමේන්තුවේ බිත්ති කබඩ් නව් කිරීම සඳහා සැපයුම්කරුවෙකු විසින් 2015 දෙසැම්බර් මස සඳහා සපයන ලද රුපියල් 385,246 වටිනා වීදුරු හා සවිකෘත ද්‍රව්‍ය 13 දෙසැම්බර් 2016 තෙක් අපේක්ෂිත වැඩ සඳහා භාවිතයෙන් තොරව පවතී. | පිළිගැනේ.<br>වීදුරු හා අනෙකුත් සවිකෘත ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා ඇණවුම් කර ඇත. නිශ්චිත සවිකෘත ද්‍රව්‍ය නොමැති වීමෙන් වේලාවට වැඩ ආරම්භ කිරීමට නොහැකි විය. දැනට අවශ්‍ය ද්‍රව්‍ය ලැබී ඇති හෙයින් වැඩ කටයුතු කෙරෙමින් පවතී. |
| (vii) | 2014 නොවැම්බර් 11 වන දි නර්තන පීඨයේ ගබඩාවේ පවත්වන ලද සමීක්ෂණයේදී රපියල් 920,621 ක් වටිනා තොග ද්‍රව්‍ය 38 ක් හිඟව පවතින බව අනාවරණය විය. කෙසේවෙතත්, ආයතනය විසින් මෙකී හිඟ ද්‍රව්‍ය සඳහා අදාළ වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව 2016 ජූනි මස 30 තෙක් කටයුතු කිසිවක් ගෙන නොමැත. | පිළිගනු ලැබේ.<br>පරීක්ෂණ කමිටුවක් පිහිටුවා පරීක්ෂණ පවත්වා ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කර ඇත. ඒකි නිර්දේශ කළමණාකරණ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ. |
| (viii) | අවුරුදු 04 කට වැඩි කාලයක් තිස්සේ වැඩ තහනම් කළ නිළධාරීන් 03 දෙනෙකුගෙන් ලැබිය යුතු කාර්‍ය මණ්ඩල ණය මුදල් ශේෂය රුපියල් 493,454 ක් ඉතිරිව පවතී. කෙසේවෙතත්, හිඟව පවතින ශේෂය 2016 ජූනි මස 30 තෙක් ඇපකරුවන්ගෙන්වත් අය කර ගැනීමට කටයුතු කර නොමැත. | පිළිගැනේ.<br>නිළධාරීන් තිදෙනාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග තවමත් ක්‍රියාවට නැංවෙමින් පවතින අතර තවමත් අවසන් කර නොමැත.එබැවින් කියන ලද නිළධාරීන්ගේ නඩු කටයුතු අවසන් වූ වහාම එම නිළධාරීන්ගෙන් ඉතිරිව ඇති ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ix) | අත්තිකාරම් රුපියල් 14,393 ක මුදලක එකතුවක් අදාළ නිළධාරීන් 04 දෙනෙකුගෙන් අය කර ගැනීමට කටයුතු නොකර අවුරුදු 04 ක කාලයක් තිස්සේ පවතී. | පිළිගනු ලැබේ.<br>මෙය නැගෙනහිර විශ්ව විද්‍යාලයෙන් මාරු කරනු ලැබූ ආරම්භක ශේෂය වන අතර මෙම ශේෂය 2016 වසරේ ගිණුම් පොත්වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (x) | පශ්චාත් උපාධිය නිම නොකළ හේතුවෙන් සේවය අත්හිටුවන ලද කථිකාචාර්යවරුන් 03 දෙනාගෙන් හිඟව ඇති ශේෂය වන රුපියල් 650,156 ක මුදල ඇපකරුවන්ගෙන් අය කිරීමට කටයුතු නොකර ඉතිරිව පවතී. | විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදල් ආපසු ලබා ගන්නා විට ඉතිරිව ඇති ශේෂය අයකරගනු ලැබේ. මේ සේවකයන් තවමත් විඅඅ ආපසු ලබා ගැනීම සඳහා අයදුම් කර නොමැත. |

| | | |
|---|---|---|
| 4.4. නිවස සඳහා බදු ගෙවීම | | |
| (i) | මුරෙ 835 අනුව තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තාව ලබා නොගෙන ගොඩනැගිලි ලබා ගැනීම සඳහා පිළිවෙළින් රුපියල් 20,000 හා රුපියල් 30,000 2008 හා 2011 වසරවල නිවාස දෙකක හිමිකරුවන් සමඟ ආයතනය ගිවිසුමකට එළඹීය. | පිළිගනු ලැබේ.<br>අනාගතයේදී මෙය නිරවද්‍ය කරනු ලැබේ. |
| (ii) | ආයතනය තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තාව ලබා ගෙන තවත් නිවාස 08 ක් බදු පදනමක් මත ලබා ගැනීම සඳහා තක්සේරුකරුගෙන් බදු වටිනාකම ලබා නොගෙන ගිවිසුම්වලට එළඹ ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස රුපියල් 1,285,500 ක මුදලක් ගෙවීමට සිදුවී ඇත. | පිළිගනු ලැබේ.<br>අනාගතයේදී මෙය නිරවද්‍ය කරනු ලැබේ. |
| (iii) | ආයතනයේ අධ්‍යක්ෂවරයා අතර හා අදාළ දේපළ හිමියන් සමඟ ඉහත සඳහන් බදු ගිවිසුම් අත්සන් කර ඇතත් මේකී බදු ගිවිසුම් ලේඛණ ලියාපදිංචි කිරීමේ ආඥා පණතේ 17 වන වගන්තිය ප්‍රකාර ඉඩම් පදිංචි කිරීමේ ලේඛණයේ ලියාපදිංචි කර නොමැත. | පිළිගනු ලැබේ.<br>අනාගතයේදී මෙය නිරවද්‍ය කරනු ලැබේ. |
| 4.5. අධ්‍යයන කටයුතු | | |
| | සමාලෝචිත වර්ෂය තුළ කර්ණාටක සංගීත දෙපාර්තමේන්තුවේ අවසන් වසර සිසුන්ගේ පළමුවන අධ්‍යයන වාරය සඳහා විෂයයන් 07ක දේශණ සඳහා පැය 690 ක් වෙන් කර ඇත. කෙසේ නමුත් ස්ථිර හා බාහිර කථිකාචාර්යවරුන් විසින් පැය 297 ක දේශණ පමණක් නිම කර ඇත. ඒ අනුව අදාළ ශිෂ්‍යයන් මුළු දේශණ සංඛ්‍යාවෙන් 57% ක් අවසන් නොකර අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට සිදුවී ඇත. අදාළ විෂයයන්ට ප්‍රමාණවත් දැනුමක් නොමැතිව උපාධි සහතිකය ලබා ගැනීම සඳහා මෙම පුරුද්ද අනුගමනය කර තිබේ. | තොරතුරු තාක්ෂණය,,සමාජ සහජීවනය හා ශ්‍රී ලංකා අධ්‍යයනය, මූලික විද්‍යාව සහ ඉංග්‍රීසි භාෂාව වැනි අමතර විෂයයන් අධ්‍යයන පාඨමාලා 4 සඳහා පොදු විය. ඉහත විෂයයන් සඳහා තනි කාල සටහන් තිබුණු නමුත් සියළුම සිසුන්ට දේශණ පැවැත්වූයේ එකවරටය. |

<table>
<tr><td colspan="6">4.6. කොන්ත්‍රාත් පරිපාලනය</td></tr>
<tr><td colspan="6">අ ආයතනය තුළ පිහිටි විශ්ව විද්‍යාල ජාලය ව්‍යාප්තිය, සැපයීම, ස්ථාපනය, මෙහෙයුම, නඩත්තු කිරීම සඳහා . රුපියල් 9,147,841 වටිනාකමින් යුතු කොන්ත්‍රාත්තුවක් පෞද්ගලික සමාගමකට පිරිනමා ඇත. මේ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ පහත දැක්වේ.</td></tr>
<tr><td rowspan="2">(i)</td><td rowspan="2">අනුමත කාර්මික නියමයන්ට අනුව සමාගම විසින් Sortex වෙළෙඳ නාමය සහිත UPS සැපයිය යුතුය. කෙසේවෙතත් සමාගම කාර්මික නියමයන් අනුව හා ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ තීරණය ගැන නොසළකා ටෙක්ෆයින් UPS සපයා</td><td>ඕළු ගණන් දුන් සැපයුම්කරුවන්</td><td>ඒ.ඩී පෙරේරා</td><td>ලංකා කොම් සර්විසස්</td><td>ඇඩ්වාන්ස් මයික්‍රෝටෙක් නොලොජි</td></tr>
<tr><td>ලංසුකරුවන් තෝරීම</td><td>දෙවන අඩුම</td><td>ඇප ලංසු තැබීමේ</td><td></td></tr>
</table>

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සැපයුම්කරුට අමතරව රුපියල් 324,240 ක මුදල් ආයතනයට සිදු විය. | | | අවශ්‍යතාවය සහ නුසුදුසු විය. | |
| (ii) | ආයතනය තුළ පිහිටි විශ්ව විද්‍යාල ජාලය ව්‍යාප්තිය, සැපයීම, ස්ථාපනය, මෙහෙයුම, නඩත්තු කිරීම සඳහා වූ. කොන්ත්‍රාත්තුව 2015 අගෝස්තු මස 15 දිනට පෙර අවසන් කළ යුතුව තිබිණි. කෙසේවෙතත්, එය අවසන් කරනු ලැබුවේ 2015 ඔක්තෝබර් මස 10 වනදාය. මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාර රුපියල් 256,137 ක මුදලක් කල් ඉකුත්වීමෙන් ඇති වූ හානි සඳහා සැපයුම්කරුගෙන් අය කරන ලදී. | තාක්ෂණික හා මූල්‍යමය අවශ්‍යතා පදනම් මත කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසු අනෙකුත් සැපයුම්කරුවන්ගේ මිළගණන් සංසන්දනය කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.<br><br>මෙම ගැටළුව අනාගතයේදී මෙවැනි ආකාරයේ ක්‍රියාවලියක් සිදු නොවන බවට තිර්ණය කර ගැනීමට වග බලා ගනු ලැබේ. | | | |
| ආ. නිළ නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම | | | | | |
| | 2012 වසරේදී ආයතනයේ අධ්‍යක්ෂවරයාට නවාතැන් පහසුකම් සැපයීම සඳහා ආයතනය විසින් නිළ නිවාසය රුපියල් 646,707 ක් වියදම් කර ප්‍රතිසංස්කරණය කරනු ලැබුවත් ප්‍රතිසංස්කරණය කරනු ලැබූ කාර්යය සඳහා භාවිතා නොකර .ප්‍රතිසංස්කරණය අවසන් කිරීමෙන් පසුව එය සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ලෙසට භාවිතා කරනු ලැබීය. කෙසේනමුත්, අධ්‍යක්ෂවරයාට නවාතැන් පහසුකම් සැපයීම සඳහා මාසික කුලි ගාස්තු පදනමක් මත මාසිකව කුලී ගාස්තු වශයෙන් රුපියල් 35,000.00 ක් ගෙවමින් ආයතනය විසින් තවත් ගොඩනැගිල්ලක් ලබා ගැනීමට සිදු වී ඇත. | පිළිගනු ලැබේ.<br>අධ්‍යක්ෂවරයාගේ නිළනිවස ප්‍රතිසංස්කරණය කළ නමුත් සෞඛ්‍ය මධ්‍යස්ථානයක් සහ සැපයීම් ගබඩාවක් සඳහා වූ හදිසි අවශ්‍යතාවය ගැන සළකමින් අධ්‍යක්ෂවරයාගේ මනාපය සහිතව එය භාවිතා කරනු ලැබුවේ 2012 වසරේ සිටය.<br><br>අධ්‍යක්ෂවරයාගේ නිළනිවස කුලියට ගනු ලැබුවේ 2016 වසරේදී බව කරුණාවෙන් දන්වනු මැනවි. | | | |
| ඇ. අරමුදල් ඌණ උපයෝජනය | | | | | |
| (i) | ප්‍රාග්ධන වැඩ 07 ක් ඉටු කිරීම සඳහා 2013 වසරේ ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ රුපියල් 10,832,346 ක එක් රැස්වූ මුදලක් අදාළ ක්‍රියාවලිය සඳහා භාවිතා නොකර 2016 ඔක්තෝබර් මස 13 දින දක්වා බැංකු ජංගම ගිණුමෙහි එසේම පවතී. | පිළිගනු ලැබේ.<br><br>ප්‍රතිපාදනය වෙන් කල වසර තුළ ආයතනයේ කාර්මික ක්ෂේත්‍රයට අදාළ නිළධාරීන් නොමැති විය. එබැවින් ඊළඟ අවුරුදු සඳහා ශේෂය ඉදිරියට ගෙන එනු ලැබ අදාළ ක්‍රියාවලියන් සඳහා දැනට එය භාවිතා කර ගෙන යනු ලැබේ. | | | |
| (ii) | තොරතුරු හා සන්නිවේදන සංවර්ධන ව්‍යාපෘතිය සිසුන් කේන්ද්‍රගත ඉගැනුම් ව්‍යාපෘතීන් හා පර්යේෂණ සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය ආදිය ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කළ ප්‍රතිපාදනය වන රුපියල් මිලියන 37.75 ක අරමුදලක් 2014 වසර තෙක් අපේක්ෂිත ක්‍රියාවලිය සඳහා භාවිතා නොකර බැංකු ජංගම ගිණුමෙහි ඇත. | | | | |
| ඈ. අර්ධ ස්ථාවර දේශන ශාලා 03 ක් ඉදි කිරීම | | | | | |

| | | |
|---|---|---|
| | නිසි සක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර නැගෙනහිර විශ්ව විද්‍යාලය විසින් අර්ධ ස්ථාවර දේශන ශාලා ඉදි කිරීම සඳහා රුපියල් 10,708,750.00 වටිනා කොන්ත්‍රාත්තුවක් ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයට ප්‍රදානය කරන ලදී. කෙසේ වෙතත් වාතාශ්‍රය නොමැති වීම නිසා දේශන ශාලා භාවිතා කිරීමට සිසුන් විරුද්ධ වූ බැවින් ඉදි කළ දින සිට ගොඩනැගිල්ල ඌණ උපයෝජනය විය. | පිළිගනු ලැබේ.<br>කෙසේවෙතත්, අර්ධ ස්ථාවර දේශන ශාලා අපේක්ෂිත ක්‍රියාවලිය සඳහා සිසුන් විසින් උපයෝගි කර ගනු ලැබේ. |
| 4.7. මානව සම්පත් කළමණාකරණය | | |
| (අ) | ගබඩා භාරකරු තනතුර 2014 ජූලි මස 02 වනදා සිට පුරප්පාඩුගතව පවතී. කෙසේ වෙතත් ස්ථිර නිළධාරියෙකු ඉහත තනතුර සඳහා පත් නොර නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ගබඩා භාරකරු ඉහත තනතුර සඳහා වැඩ බලන පදනමක් මත රාජකාරි ඉටු කර ඇත. | සේවය අත්හිටුවීමෙන් අනතුරුව ගබඩා භාරකරු කම්කරු විනිශ්චය සභාවට නඩු පවරා ඇත. එය තවමත් විභාග වෙමින් පවතින නිසා ඒකී පුරප්පාඩුගත සේවක සංඛ්‍යාව පිරවිය නොහැකිව තිබේ. |
| (ආ) | 2013 ජනවාරි 01 දින සිට 2016 ඔක්තෝබර් මස 07 දක්වා කථිකාචාර්ය (පරිවාස) සඳහාවූ අධ්‍යයන සේවක සංඛ්‍යා තුනක්ද ශ්‍රව්‍ය දෘෂ්‍ය තාක්ෂණ නිළධාරි තනතුරු සඳහා බඳවා ගෙන නොමැත. | දැනටමත් ප්‍රචාරය කර සම්මුඛ පරීක්ෂණයද පවත්වන ලදී. නමුත් සුදුසු අපේක්ෂයෙකු බඳවා ගැනීම සඳහා තෝරා ගැනීමට නොහැකිවිය. දැනට නැවතත් දැන්වීම් කරන ලදුව සම්මුඛ පරීක්ෂණය කෙටි කලකින් පැවැත්වේ. |
| (ඇ) | සමාලෝචිත වසරේ ආයතනයේ අනුමත තාවකාලික කථිකාචාර්ය තනතුර සඳහා වූ අධ්‍යයන සේවක සංඛ්‍යාව 05 වන අතර ආයතනයේ තාවකාලික කථිකාචාර්යවරුන් 18 දෙනෙකු සිටියහ. | පිළිගනු ලැබේ.<br>මූල්‍ය ප්‍රතිපාදන සැළකිල්ලට ගනිමින් සමත්වූ සිසුන්ට කුසලතා මත අවුරුද්දක කාල සීමාවක් සඳහා පත්වීම් ලබාදීම විශ්ව විද්‍යාලයේ භාවිතය වී තිබේ. |
| 5. වගකීම හා යහ පාලනය | | |
| 5.1. | මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම | |
| | රාජ්‍ය ව්‍යාපාර අංක: PED/02 හා 2003 ජූනි 02 දිනැති චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාර සමාලෝචිත වසරේ මුදල් වසර අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශය විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුව ඇත. කෙසේ නමුත් සමාලෝචිත වසරේ මූල්‍ය ප්‍රකාශය විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ මාස 04 ක ප්‍රමාදයකින් පසුව 2016 ජූනි මස 10 වන දිනදීය. | පිළිගනු ලැබේ.<br>අනාගතයේදී මෙය නිරවද්‍ය කරනු ලැබේ. |
| 5.2. ප්‍රසම්පාදන සැළසුම | | |
| | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.1.(අ) හා 4.2.3 වගන්ති ප්‍රකාර අඩුම ගණනේ අවුරුදු තුනක කාලයක් තුළ සකස් කළ යුතු අපේක්ෂිත ක්‍රියාවලියන් ඇතුලත්වූ ප්‍රධාන ප්‍රසම්පාදන සැළසුම සකස් කර නොමැත. | පිළිගනු ලැබේ.<br>ප්‍රායෝගික වශයෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැළසුම අවුරුද්දක කාලයක් සඳහා සකස් කරන ලදී. කෙසේ වෙතත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2016 වසරේ සිට අනුගමනය කරනු ලැබේ. |
| 5.3. අභ්‍යයන්තර විගණනය | | |

| | | |
|---|---|---|
| | නිත්‍ය හා විෂය නිර්ණලිත ප්‍රවේශයක් භාවිතා කරමින් අවදානම් කළමණාකරණය, යහපාලනය හා පාලන කටයුතු වැඩි දියුණු කිරීම හා ඇගයීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කළ යුතුව තිබුණු නමුත් 2005 වසර තෙක් ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර නොතිබුණි. සමාලෝචිත වසර තුළ ආයතනයෙහි පුරප්පාඩුගතව පැවති අභ්‍යන්තර විගණක තනතුරේ රාජකාරිය නැගෙනහිර විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර විගණක විසින් ඉටු කරන ලදී. | පිළිගනු ලැබේ. පුරප්පාඩුගතව ඇති සහකාර අභ්‍යන්තර විගණක තනතුර පිරවීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව වෙත දැනටමත් දන්වා ඇත. ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීම සඳහා කටයුතු කර ඇත. |
| 5.4. වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය පැවැත්වීම | | |
| | විශ්ව විද්‍යාල කොමිසම් සභාවේ අංක 04/2013 හා 2013 අප්‍රේල් 10 දිනැති ආයතන චක්‍රලේඛ ලිපිය ප්‍රකාර සමාලෝචිත වසරේ අදාළ වර්ෂය සඳහාවූ වාර්ෂික සමීක්ෂණයක් පැවැත්විය යුතු අතර ඒ අනුව වන වාර්තාව 2016 මාර්තු මස 17 වන දිනට පෙර විගණකාධිපති වෙත සැපයිය යුතුව ඇත. කෙසේ නමුත් 2016 ජූනි මස 30 වූ නමුත් ආයතනය විසින් සමීක්ෂණ මණ්ලයක් පවත්වා නොමැත. | පිළිගනු ලැබේ. 2013 හා 2014 වාර්ෂික සමීක්ෂණයේදී ඇතිවූ භාණ්ඩ අඩුපාඩුකම් සඳහාද ක්‍රියාවිරහිතව තිබූ භාණ්ඩ සඳහාද පරීක්ෂණයක් සිදු කරන ලදී. ඒවා වෙන්දේසි කිරීමට හෝ නිශ්කාෂණය කිරීමට කළමණාකරණ මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගන්නා ලදී. |
| 5. පද්ධති හා පාලන | | |
| නිරීක්ෂණය කරන ලද පද්ධති හා පාලනවල අඩුපාඩුකම් පිළිබඳව වරින් වර ආයතන අධ්‍යක්ෂවරයා වෙත දැනුම්දී ඇත. පාලන ක්‍රමයේ පහත දැක්වෙන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානයක් අවශ්‍යවේ. | | |
| (අ) ස්ථාවර වත්කම් පාලනය කිරීම : සම්පූර්ණයෙන්ම ක්ෂයවූ වත්කම්වල සාධාරණාත්මක ඇගයීම ඉදිරිපත් කිරීම.<br><br>(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය : කල් ඉකුත්වීමෙන් ඇති වූ හානි සඳහා අයකරගැනීම, දීර්ඝ කිරීම් සඳහා වූ අනුමැතිය සහ කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලවීම. | | සටහන් කර ඇත. |

**ආචාර්ය එස්.ජේයසංකර්**
**අධ්‍යක්ෂක**
**ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය**
**ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය**